ආයතනයේ නම : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் : தேசிய மிருகக்காட்சி சாலைத் திணைக்களம்

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பில் நிலையியற் கட்டளை 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளையும் எடுத்த நடவடிக்கைகளையும் பாரளுமன்றத்தில் சமர்ப்பித்தல்.

Name of the institution : Department National Zoological Garden

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order NO.119 (4)

පාර්ලිමේන්තු සභා ලේකම් මගින්,

පාර්ලිමේන්තු මහ ලේකම්,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,

ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ.

<u>2019,2020 හා 2021 විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය</u>

උක්ත රැස්වීම් වාර්තාව අනුව දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් නියෝගවලට අදාළ වර්තමාන තත්ත්වය පහත දක්වා ඇත.

	විස්තරය	කාරක සභාව ලබා දුන් නියෝග	වර්තමාන තත්ත්වය
01	රිදීයගම සෆාරි උද්‍යානය සහ පින්නවල වාගොල්ල නව සත්වෝද්‍යානය ජාතික සත්වෝද්‍යාන පනතට ඇතුළත් කර නොතිබීම. 2016.03.08 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී රිදියගම සෆාරි උද්‍යානය සහ පින්නවල වාගොල්ල නව සත්වෝද්‍යානය, ජාතික සත්වෝද්‍යාන පනතට ඇත්ළත් කර පනත සංශෝධනය කරන ලෙස නියෝග කර ඇතත්, මෙතෙක් එම නියෝග ක්‍රියාත්මක කර	i. මසක් ඇතුළත ජාතික සත්වෝද්‍යාන පනතේ අදාළ සංශොධන කටයුතු අවසන් කර එවන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් දැනුම් දුන් බව සඳහන් කර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමුකරන ලෙසට i. මෙම පනත සංශෝධනය කිරීමේ කාර්යය සම්බන්ධයෙන් වාර්තාවක් 2023.08.05 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට	• මගේ අංක DZG/Dev/2/4/Zoo/Act./87 Volu.II හා 2023.07.27 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති අතර, • පනත සංශෝධනය කිරීමේ කාර්යය සම්බන්ධ වාර්තාව ඇමුණුම 01 මගින් ඔබ වෙත මින් ඉහතදී යොමුකර ඇත. රිදියගම සෆාරි උද්‍යානය සහ පින්නවල සත්වෝද්‍යානය ජාතික සත්වෝද්‍යාන පනතට ඇතුළත් කිරීමට ඒ වනවිටත් කටයුතු කර තිබුණි. • අමාත්‍ය මණ්ඩල

	නොමැති වීම. මෙම ප්‍රමාදය පිළිබඳ කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය.		සංදේශය කෙටුම්පත් කර අමාත්‍යංශය වෙත යොමුකර ඇත. කැබිනට් පත්‍රිකාවට ඇතුළත් විය යුතු කරුණු සම්බන්ධයෙන් සාකච්ඡාවක් පරිසර අමාත්‍යංශයේ ලේකම්තුමන් සමඟ 2025.06.12 දින පවත්වන ලද අතර පනතෙහි සංශෝධන සම්බන්ධයෙන් වන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීමට නියමිත වේ.
02.	2009-2015 කාලසීමාව තුළ ප්‍රමාණවත් පර්යේෂණයන් සිදුකර නොතිබීම.	i. අධ්‍යාපන හා පර්යේෂණ සහකාර තනතුර යටතේ බඳවාගත් නිලධාරීන් විසින් පර්යේෂණ රැසක් සම්බන්ධයෙන් අවශ්‍ය පසුබිම සකස් කිරීමේ කාර්යයන් ඉටුකරන ලද බව ii. මේ වනවිට ඔවුන් සංවර්ධන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කර ඇති බැවින් දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල සේවය කරන බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.	මෙම තනතුර සඳහා බඳවාගත් නිලධාරීන් සංවර්ධන සහකාර තනතුරේ සිට සංවර්ධන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය වී වෙනත් කාර්යාල වෙත ස්ථානමාරු වීම හේතුවෙන් පර්යේෂණ සිදුකිරීමේ සම්භාවිතාව පහල මට්ටමක පැවතිණි. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුගත තනතුරක් ලෙස පර්යේෂණ නිලධාරි තනතුරක් නිර්මාණය කර දෙන ලෙසට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමුකර ඇත. තවද, විධිමත්ව අංශ මට්ටමින් තනතුරු ස්ථාපිත කරන තෙක් විශ්ව විද්‍යාල සිසුන් සහ ස්වේච්ඡා සංවිධාන සමඟ එක්ව 2023 වර්ෂය සඳහා පර්යේෂණ 17ක් හා 2024 වර්ෂය සඳහා 09ක් සිදුකර ඇත.

03.	වඳ වී යාමේ තර්ජනයට ලක් වූ සතුන් සංරක්ෂණය කිරීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවීම.	i. වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති බවට හඳුනා ගන්නා සියලුම සත්ත්ව විශේෂ සංරක්ෂණය සඳහා කටයුතු කළ යුතු බව ii. එම සත්ත්වයින් සංරක්ෂණය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් කමිටුවක් පත් කර, ක්‍රියාකාරී සැලැස්මක් ද සමඟ සම්පූර්ණ වාර්තාවක් 2023.08.05 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. ට නියෝග කළේය.	ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක්ව ඇති විශේෂයන්ගේ රතු ලැයිස්තුවහි වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති සතුන් සංරක්ෂණය කිරීම සඳහා ගත හැකි ප්‍රධාන පියවර හා උපාය මාර්ග ක්‍රියාත්මක කරන අතර, එම සත්ත්වයින් සංරක්ෂණය කිරීම සඳහා යෝජිත ආයතනික ව්‍යුහයක් සකස් කිරීමට කටයුතු කර ඇත. වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශ ලේකම් විසින් අන්තර් ආයතනික ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා දායක විය යුතු ආයතන පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් ද යොමු කර ඇත.
04.	"ශ්‍රී ලංකා දිවියා රතු දත්ත පොතේ වඳ වී යාමේ ඉහළ අවධානමක් ඇති" (Most endangered) යන වර්ගීකරණයේ සිට පහළ අවදානම් මට්ටමකට (Endangered) ඇතුළත් කර තිබීම කාරක සභාවේ අවධානයට ලක් වීම.	i. රතු දත්ත පොතේ දේශීය තොරතුරු ඇතුළත් කිරීමේදී පදනම් කර ගනු ලබන්නේ ස්වාධීන පර්යේෂකයින් සහ වෙනත් මූලාශ්‍රවලින් ලබාගන්නා දත්ත වන බැවින් මෙවැනි වර්ගීකරණයන් සඳහා ජාතික සංගණනයක් යටතේ ලබාගත් විධිමත් පර්යේෂණ දත්ත උපයෝගී කරගැනීමේ වැදගත්කම කාරක සභාව පෙන්වා දුන්නේය.	ශ්‍රී ලංකා කොටියා 2007 හි ප්‍රකාශිත රතු දත්ත ලැයිස්තුව යටතේ අවදානමට ලක් වූ (Vulnerable –VU) කාණ්ඩයට අයත්ව පැවති බවත්, ඉන් අනතුරුව 2012 වර්ෂයේදී ප්‍රකාශිත රතු දත්ත ලැයිස්තුවෙහි තර්ජනයට ලක්වූ (Endangered – EN) කාණ්ඩයට නම් කර ඇති බවත් දක්වා ඇති අතර, ඒ අනුව ශ්‍රී ලංකා කොටියා තර්ජන මට්ටමෙන් ඉහල තත්ත්වයකට පත්වී ඇති බව සඳහන් කර ඇති අතර, රතු දත්ත පොත සැදීම සඳහා මූලිකව කටයුතු කරන්නේ

			IUCN ආයතනය බවත් සඳහන් කරමි.
05.	පින්නවල වාගොල්ල සත්වෝද්‍යානය මෙම සත්වෝද්‍යානය ශ්‍රී ලංකාවට ආවේණික හා වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇති සත්ත්ව විශේෂ ආරක්ෂා කිරිම සඳහා වූ සංරක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, දැනට එහි සිටිනුයේ ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ 03කට අයත් සතුන් 10 දෙනෙකු පමණක් වීම.	i. ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම සත්වෝද්‍යානයේ ලෝක සත්ත්ව කලාපය ඉදිකිරීමේ කටයුතු මේවනවිට නවත්වා ඇති බව ii. සත්වෝද්‍යානයට සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය කරගැනීමේ අරමුණින් ඉදිරියේදී දේශීය සත්ත්ව කලාපයට විදේශීය සතුන්ද ඇතුළත් කිරීමට කටයුතු කරගෙන යන බව	ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව දීර්ඝ කාලයක් තිස්සේ පැවති විරෝධතා හේතුවෙන් පින්නවල සත්වෝද්‍යානයේ ලෝක කලාපය සඳහා ඉඩම් (අක්කර 78) අත්පත් කර ගැනීම 2021 දී නතර කරන ලදී. ඒ අනුව දැනට සත්වෝද්‍යානය පවතින භූමිය දේශීය විදේශීය සත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. 2025 වසරේදී සිංහයින් සඳහා අරණක් ඉදි කිරීම, දේශීය විදේශීය උරග විශේෂ ප්‍රදර්ශනය සඳහා උරග උයනක් සඳහා නිර්මාණ කටයුතු කිරීම මේ වන විට සිදු කරමින් පවතී. දැනට සත්වෝද්‍යානය තුල දේශීය හා විදේශීය සත්ව විශේෂ 38ක් ප්‍රදර්ශනය කරනු ලැබේ. මීට අමතරව උද්‍යානයේ විවෘත සමනල අරණ තුල සමනල විශේස 35ක් පමණ වාර්තා වී තිබේ. එසේම 2025 වසරේ පින්නවල සත්වෝද්‍යානය විසින් ශ්‍රී ලංකා දිවියන් කෘතිමව අභිජනනය කිරීම සිදු කරන ලද අතර කෑගල්ල දිස්ත්‍රික්කයේ කුඩා ප්‍රදේශයක පමණක් හඳුනාගත හැකි වඳවී යාමේ දැඩි තර්ජනයට ලක් වී සිටින බන්දුල පෙතියා

			මසුන් සත්වෝද්‍යානය තුළ අභිජනනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ඇති කිරීමට ඇස්තමේන්තු සකස් කර ඇත.
06.	සත්වෝද්‍යානයේ සී.සී.ටී.වී කැමරා පද්ධතියේ දෝෂ පැවතීම සහ ගොඩනැඟිලි භාවිතයේ හා අපජල කළමනාකරණ පද්ධතියේ අඩුපාඩු පැවතීම.	• සී.සී.ටී.වී කැමරා පද්ධතියේ කැමරා කිහිපයක් පමණක් අවශ්‍ය උපාංග නොමැතිවීම හේතුවෙන් අක්‍රියව පැවතියද එය ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව • සත්වෝද්‍යාන භූමියේ ඉදිකර ඇති හෝටලය මේ වනවිට ටෙන්ඩර් පටිපාටිය හරහා ගැනුම්කරුවෙකු වෙත ලබාදී ක්‍රියාත්මක කෙරෙන බව • අපජල කළමනාකරණ පද්ධතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටලු පවතින බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.	• සී.සී.ටී.වී. කැමරා පද්ධතිය සම්බන්ධයෙන් සේවා ගිවිසුම්ගත ආයතනය වන SLTS ආයතනය මඟින් අක්‍රියව පැවති කැමරා කිහිපය පරීක්ෂා කරන ලද අතර එහිදී එම ආයතනය මඟින් එම කැමරා, එහි ආයු කාලය ඉක්මවා භාවිතා කර ඇති බැවින්, අළුත්වැඩියා කිරීම නොව නව කැමරා සවි කිරීම වඩාත් යෝග්‍ය බව ලිඛිතව දන්වන ලදී. ඒ අනුව, 2025 වර්ෂයේදී නව කැමරා සවි කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති අතර මෙම වර්ෂයේදී එහි කටයුතු අවසන් වේ. • මේ වන විට NES (New Elephant Shed) ප්‍රදේශයේ අලි මඩුවල ජලය, පෙරහන් ඒකකය හරහා පෙරීමකට ලක් කොට නිදහස් කරයි. CEA (Central Enviroment Authority) මඟින් ජල සාම්පල පරීක්ෂා කරගැනීම සිදුකරන ලද අතර, එහි BOD (Bio chemical Oxygen Demand - ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම) අගය වැඩිවීම හේතුවෙන් එය

			අඩුකිරීම සඳහා පෙරහන් පද්ධතියට ගහණයක් ආමුකූලනය කළයුතු බව දන්වන ලදී. ඒ පිළිබඳව පරික්ෂා කර බැලීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙත දැනුවත් කරන ලදී.
07.	සත්වෝද්‍යානය තුළ සංචාරකයින්ගේ ගමන් පහසුව සඳහා යොදාගත් BUGGY රථ අක්‍රියව පැවතිම.	• 2017 හා 2018 වර්ෂවලදී මිලදී ගෙන පින්නවල හා දෙහිවල සත්වෝද්‍යානවල භාවිතයට යොදාගත් BUGGY රථ 17ක් බැටරිවල ආයු කාලය අවසන් වීම හේතුවෙන් අක්‍රිය තත්ත්වයේ පවතින බව • නැවත බැටරි යෙදීම සඳහා එක් රථයකට රු.698,000/- ක් පමණ වැය කිරීමට සිදුවන බව	බගී රථ 11ක් වාගොල්ල සත්වෝද්‍යානයේ පවතින අතර, ඉන් 03ක් මේ වසර මුලදී හම්බන්තොට සෆාරි උද්‍යානය වෙත ලබාදී ඇත. ඉතිරි බගී රථ 8න් 06ක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අතර, 02ක් අළුත්වැඩියා කිරීම සඳහා සේවා ගිවිසුම්ගත ආයතනය වන RTS ආයතනය වෙත යොමුකර ඇත. පින්නවල අලි අනාථාගාරයේ පැවති බගී රථ 03න් 02ක් දෙහිවල සත්වෝද්‍යානයට ලබා දී ඇති අතර, පවතින බගී රථය ධාවන කටයුතු සඳහා භාවිතා කරයි.
08.	විදේශිය පක්ෂීන් මිල දී ගැනිමෙ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධව අඩුපාඩු පැවතිම.	• නියමිත ටෙන්ඩර් කොන්දේසි සැපිරීමට අපොහොසත් වීම හේතුවෙන් ලංසු ඉදිරිපත් කළ සැපයුම්කරුවන් දෙදෙනෙකු ප්‍රතික්ෂේප වූ බව • එබැවින් ඉතිරි සැපයුම්කරුගෙන් පක්ෂීන් මිලදී ගැනීම සිදුකළ බව	පක්ෂීන් මිළ දී ගැනීම පිළිබඳව සකස් කරන ලද වාර්තාව මින් ඉහතදී ඇමුණුම 04 මඟින් දක්වා ඇත. ජාතික සත්වෝද්‍යානය සඳහා සතුන් මිලදී ගැනීමේදී නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීම ඇතුළුව අනුගමන කළ යුතු ක්‍රියාමාර්ග/මාර්ගෝපදේශ ඇතුළත් කර අංක 03/2023 දරණ දෙපාර්තමේන්තු

			අභ්‍යන්තර චක්‍රලේඛයක් අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ අංක NZG/AD/01/Dep.Or.19 vol(1) හා 2023.08.08 දිනැති ලිපිය මඟින් නිකුත් කර ඇති අතර එම චක්‍රලේඛය ප්‍රකාරව දැනටමත් සතුන් මිලදී ගැනීමේ කටයුතු සිදු කරයි.
09	රිදියගම සෆාරි සත්වෝද්‍යානය සම්බන්ධයෙන් පවතින ගැටළු	මෙම සෆාරි සත්වෝද්‍යානයේ අර්ධ වශයෙන් ඉදිකිරීම් සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් 2023.08.05 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.	සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් සම්බන්ධව සම්පූර්ණ වාර්තාවක් ඇමුණුම 05 මඟින් යොමුකර ඇත.
	2017 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රුපියල් මිලියන 215 ක් පමණ වැය කර නිම කර ඇති ඉදිකිරීම් මේ දක්වා භාවිතයට ගෙන නොමැති බව කාරක සභාවේදී අනාවරණය වීම.	• එම ඉදිකිරීම් අතරින් ඕස්ට්‍රේලියානු කලාපය සඳහා ඉදිරියේදී හුවමාරු වැඩසටහන් යටතේ සතුන් ලබාගැනීමෙන් අනතුරුව එය විවෘත කිරීමට අපේක්ෂා කරන බව • වීටා සහ දිවි කලාපවල තවත් ඉදිකිරීම් සිදුකළ යුතුව පවතින බව • රිදියගම සෆාරි උද්‍යානයේ සිටින සතුන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංඛ්‍යාත්මකව ලේඛනගත කිරීම මේ වනවිට සිදුකර ඇති බව • සත්වෝද්‍යානය තුළ සිටින තාරකා ඉබ්බන් අධිකරණ නියෝග මත රඳවාගෙන සිටින සතුන් බව • සත්වෝද්‍යානයේ මාර්ග පද්ධතියේ සංවර්ධන කටයුතු 2023 වර්ෂයේ සැප්තැම්බර් මස වනවිට අවසන් කිරීමට අපේක්ෂිත බව • පශු වෛද්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලයේ අඩුපාඩු පිරවීම සඳහා	i. මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ඇත. ii. Cheetah Dens - ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම සඳහා 2025.06.13 දින ප්‍රසම්පාදන දැන්වීම් පල කර ඇත. iii. Exotic Bird Enclosures - 2025 වර්ෂයේ මැයි 31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 55% ක් වේ. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දැල් ලබාගැනීමෙන් පසු ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට යෝජිතය. iv. Land Cleaning, Fence Construction andInternal

		කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති බව	Gravel Road Construction in Australian Zone - මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ඇත. v. Tree Huts - ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් ඒ සඳහා නිර්මාණ, සැලසුම් සකස් කරමින් පවතී. vi. Boundary Fence and Gate in Leopard Zone - ජාතික තරගකාරී ලංසු කැඳවීම මගින් සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීමෙන් පසු එම ලංසු ලියවිලි ඇගයීම් කටයුතු සිදුකිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත යොමු කර ඇත. Vii. Phase I Roads and Related Structures මේ වන විට සංචාරකයින් සඳහා විවෘත කර ඇත. viii. Village Sales Center මේ වන විට භාවිතයේ පවතී. ix. Cafeteria - මේ වන විට භාවිතයේ පවතී. x. Hard Landscaping – Cheetah zone මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ඇත.

			• පශු වෛද්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු මේ වනවිට සම්පූර්ණ කර ඇත.
10	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. 2016 වර්ෂයේ පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී ලබාදුන් නියෝගය පරිදි වසර 05 ක් සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සම්බන්ධව ප්‍රගතිය	i. දැනට සකස් කරමින් පවතින 2024 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා වූ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ (Action Plan) කටයුතු අවසන් කර, වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සමඟ 2023.12.31 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම. ii. මෙම සැලැස්ම සකස් කිරීම සඳහා පත් කර ඇති කමිටුව මගින් ඉදිරි මාස 06 තුළ සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාවලිය සහ අදාළ කාලරාමුව ඇතුළත් වාර්තාවක් 2023.08.05 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.	2024 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා වූ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික සැලැස්ම (Strategic plan) සකස් කර, වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඒ අනුව සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.
11	පින්නවල අලි අනාථාගාරයේ කසල කළමනාකරණය පිළිබඳ ගැටළු	• මෙම කසල ප්‍රමාණය අධික බැවින් ක්‍රෂර් යන්ත්‍රයක් යොදා කසළ කළමනාකරණය කිරීමට පෞද්ගලික ආයතනයක් වෙත ටෙන්ඩර් පටිපාටිය හරහා භාර දුන් නමුත් එම ආයතනය විසින් මෙම කාර්යය ඉටුකළ නොහැකි බවට මේ වනවිට දන්වා ඇති බව • රජයේ කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් එම යන්ත්‍රය සකස් කර ගැනීමට අපේක්ෂා කරන බව	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මගින් මෙම යන්ත්‍රය සකස් කරගැනීම සඳහා යොමු කරන ලද අතර එය සකස් කිරීමේ හැකියාව නොමැති බව සඳහන් කරන ලදී. ඒ අනුව එම යන්ත්‍රයේ කොටස් මු.රෙ.767(02) ප්‍රකාරව එම දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව භාරදෙන ලදී.

		අපේක්ෂා කරන බව	
12	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රමුඛතාවයන් ඉටු කිරීමේ ප්‍රගතිය සලකා බැලීම.	2024-2030 වර්ෂය දක්වා වූ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ, ජාතික සත්වෝද්‍යාන පනත අනුව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රමුඛතාවයන් යටතේ ලැයිස්තුගත කර ඇති එක් එක් අංශ ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු පරිදි කමිටු පත්කර එක් එක් අරමුණු ක්‍රියාත්මකභාවයට පත් කිරීමට කටයුතු කිරීම.	සත්ව හුවමාරු වැඩසටහන් ක්‍රමය යටතේ 2023 වර්ෂයේදී නෙදර්ලන්තය, තායිලන්තය, ස්ලෝවැකියාව, චෙක් ජනරජයෙන් සතුන් ගෙන්වා ඇති අතර නෙදර්ලන්තයට හා ඉන්දියාවට සතුන් ලබා දී ඇත. එමෙන්ම 2024 වර්ෂයේදී ප්‍රංශය, ජර්මනිය හා චෙක් ජනරජයෙන් සතුන් ගෙන්වා ඇති අතර රුසියාවට සතුන් ලබා දී ඇත. එමෙන්ම 2023 වර්ෂය සඳහා පර්යේෂණ 17ක් හා 2024 වර්ෂය සඳහා 09ක් සිදුකර ඇත. තවද, අධ්‍යාපනික දේශන හා ප්‍රායෝගික වැඩමුළු 21 හා විශේෂ වැඩසටහන් විශාල ප්‍රමාණයක් සිදුකර ඇත. එමෙන්ම සත්ව කූඩු වෙනුවට මාතලී අරණ, මාංස අරණ මෙන්ම මද කිපිච්ච අලින් සඳහා අරණක් ද ඉදිකරමින් පවතී.
13	ආදායම් පිළිබඳ විස්තරාත්මක වාර්තා ඉදිරිපත් කර නොතිබීම.	2023 වර්ෂයේ වර්ෂාවසාන ගිණුම් සකස් කිරීමේදී විස්තරාත්මක වාර්තාවක් ලබාදීමට කටයුතු කරන බව	2023 වර්ෂයේ සිට වර්ෂාවසාන ගිණුම් පිළියෙල කිරීමේදී සත්වෝද්‍යානයට ආදායම් ලැබෙන ආකාරය පිළිබඳව විවිධ ආදායම්ද ඇතුළුව තොරතුරු වාර්තාවක් යොමුකිරීමට කටයුතු කර ඇති බව

වෛද්‍ය දම්මික පටබැඳි,

පරිසර අමාත්‍ය

වෛද්‍ය දම්මික පටබැඳි
පරිසර අමාත්‍ය
පරිසර අමාත්‍යාංශය
"සොබාදම් පියස", අංක 416/සී/1,
රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

ඇමුණුම 01

1982 අංක 41 දරණ ජාතික සත්වෝද්‍යාන පනත සංශෝධනය සම්බන්ධයෙන් වූ වාර්තාව

2010 වර්ෂයේ දී අභියාචනාධිකරණයේ විභාග වූ පෙත්සම් අංක 777/2010 දරණ පෙත්සමකට අනුව, පෙත්සම්කරුවන් විසින් සත්වෝද්‍යාන පනත හා තවත් පනත් කිහිපයක් සංශෝධනය කළ යුතු බවට ඉල්ලීමක් කර ඇත. එම පෙත්සම් විභාගයේ දී ලබා දුන් නියෝග අනුව, එම පෙත්සමට අදාළ පනත් සංශෝධනය කළ යුතුව තිබේ. තවද, එම පෙත්සම්කරුවන් විසින් පනතට ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ද ඉදිරිපත් කර තිබුණි.

ජාතික සත්වෝද්‍යාන පනත සංශෝධනය සඳහා එවකට දෙපාර්තමේන්තුව අයත්ව තිබූ අමාත්‍යාංශ ලේකම් විසින් කමිටුවක් පත් කර, එම කමිටුව ඉදිරිපත් කල සංශෝධනවලට අදාළ යෝජනා සකස් කර ඇත.

එම යෝජනා ඇතුළත්ව, පනත සංශෝධනය සඳහා අමප/19/1998/106/029 අංක හා 2019.08.07 දින දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව, පනතට අදාළ වූ සංශෝධන ඇතුළත් කරමින් දළ කෙටුම්පත 2019.09.12 දින අමාත්‍යාංශය මගින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අංක L.D.O. 54/2019 දරණ 2020.02.24 දිනැති ලිපිය මගින් නව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව අමාත්‍ය මණ්ඩල සංදේශයක් නැවත යොමු කරන ලෙස දන්වා තිබේ. ඒ අනුව, නව අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය 2021 අප්‍රේල් 19 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලැබී ඇත. (අමප 21/0614/314/006 අංක හා 2021.04.28 දින දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය)

නව අමාත්‍ය මණ්ඩල සංදේශයේ අනුමැතිය ලැබීමෙන් පසු, දළ කෙටුම්පත නැවත 2021.05.17 දින අමාත්‍යාංශය හරහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. අනතුරුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අංක L.D.O. 54/2019 දරණ 2022.09.23 දිනැති ලිපිය මගින් ඒ සඳහා නිරීක්ෂණ එවන ලෙස ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යාංශය වෙත දන්වා එවා ඇත. එම ලිපියට අනුව, ඊට අදාළ නිරීක්ෂණ 2022.11.22 දින මෙම දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යාංශයට සඳහා යවා ඇත. අමාත්‍යාංශය විසින් ඊට අදාළ වූ සංශෝධන සඳහා කටයුතු කර, 2023.01.23 දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම

2019 වර්ෂයේ දී සකස් කරන ලද දළ කෙටුම්පත පුළුල් ලෙස සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය විය. එයට හේතු වූයේ වරින් වර ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව අයත් වූ අමාත්‍යාංශවල ගරු අමාත්‍යවරුන්ගේ සහ ලේකම්වරුන්ගේ අදහස් හා යෝජනා ය. තවද, වඩාත් පුළුල් හා සංකීර්ණ

පරාසයකින් යුතුව දෙපාර්තමේන්තුව සත්ත්ව සංරක්ෂණය සඳහා කැපවෙන බැවින්, දෙපාර්තමේන්තු කටයුතු වඩාත් විධිමත්ව හා නිසි අයුරින් පවත්වා ගෙන යාමට උචිත ලෙස නිරීක්ෂණ ඇතුළත් කරමින් එම කොටුම්පත සකස් කරන ලදී.

තවද, 1982 අංක 41 දරණ ජාතික සත්වෝද්‍යාන පනත වසර 37 ක් තිස්සේ සංශෝධනය නොවීම හේතුවෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වර්තමාන ක්‍රියාකාරකම්, යෝජිත නව ක්‍රියාකාරකම්වලට උචිත පරිදි අවශ්‍ය නීති කොටුම්පත් සම්පාදනය කිරීම හා එම පනතෙහි විධිවිධාන සංශෝධනය කිරීම අවශ්‍ය විය. ඒ අනුව, සකස් කරන ලද කෙටුම්පත ඇමුණුම අංක 01A ලෙස මේ සමග අමුණා ඇත.

මේ වනවිට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තු වෙත යොමු කර ඇති ජාතික සත්වෝද්‍යාන පනතේ නව දළ කෙටුම්පතෙහි 14 වන වගන්තියේ පද සම්බන්ධයෙන් අනාර්ථය ඉදිරිපත් කර ඇත (ඇමුණුම අංක 01A). එමගින් වර්තමානය වනවිට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් ආයතන සහ අනාගතයේ දී දෙපාර්තමේන්තුවට ඇතුළත් වේ යැයි අපේක්ෂිත සියලුම ආයතන ආවරණය වේ.

2023.07.05 දින පාර්ලිමේන්තු ගිණුම් කාරකසභාවෙන් නියෝග කළ පරිදි පනත සංශෝධනය කිරීමේ කටයුතු මාසයක් ඇතුළත අවසන් කර ලබා දෙන ලෙස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MSDW07/WL/117 (වෙළුම 1) හා 2023.07.27 දිනැති ලිපිය මගින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. ඒ අතර, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අංක L.D.O 54/2019 හා 2023.07.26 දිනැති ලිපිය මගින් සංශෝධනය කරන ලද පනතේ දළ කෙටුම්පත නිරීක්ෂණ ලබාදීම සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

01-ii

ඇමුණුම අංක -01

2023 අංක දරණ ජාතික සත්වෝද්‍යාන පනත (සංශෝධනය)

වගන්ති අංකය	1982 අංක 41 දරණ ජාතික සත්වෝද්‍යාන පනත	යෝජිත සංශෝධන	සංශෝධන ඇතුළත් කල පසු
දීර්ඝ නාමය	ජාතික සත්ව උද්‍යාන පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ද, සත්ව උද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදල පිහිටුවීම සඳහා ද, ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.	මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1982 අංක 41 දරණ ජාතික සත්ව උද්‍යාන පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කිරීම.	"වන සතුන් පරිබාහිර සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම, සත්ව සුභ සාධනය සැලසීම, ඊට අදාළ පර්යේෂණ, අධ්‍යාපන කටයුතු සඳහා ද, ජාතික සත්වෝද්‍යාන පිහිටුවීම පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ද, ජාතික සත්වෝද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදල පිහිටුවීම හා කළමනාකරණය සඳහා ද, ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත කි."
1	1982 අංක 41 දරන ජාතික සත්ව උද්‍යාන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.	1982 අංක 41 දරණ ජාතික සත්ව උද්‍යාන පනත සංශෝධනය සඳහා ඉදිරිපත් කරන සංශෝධිත පනත නම් කිරීම.	1. මෙ පනත 2023 අංක .... දරණ ජාතික සත්වෝද්‍යාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.
1.1.		පනතේ 1 වගන්තියට ඉක්බිතිව "1අ. , 1ආ. සහ 1ඇ." උප වගන්ති ඇතුළත් කිරීම.	1අ. මෙම පනතේ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා භාවිතා කළ යුතු යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින්, එම නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි දිනයක සිට සත්වෝද්‍යානයක් විය යුතු බවට ප්‍රකාශයට පත් කළ හැකි ය.

			1ආ. ඉහත 1අ. උප වගන්තිය යටතේ සත්වෝද්‍යානයක් ලෙස ප්‍රකාශිත ප්‍රදේශයකට සත්වෝද්‍යානයක මායිමේ සිට යම් නිශ්චිත දුර ප්‍රමාණයක් ඇතුළත ප්‍රදේශය අදාළ සත්වෝද්‍යානයේ ස්වාරක්ෂක කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යවරයාට බලතල ඇත්තේ ය.
2(1)	ජාතික සත්ව උද්‍යාන පරිපාලනය කිරීමේ කාර්ය සඳහා -	2 (1). උප වගන්තිය ඉවත් කර පහත සඳහන් නව උප වගන්තිය එකතු කිරීමෙන්.	2 (1). ජාතික සත්වෝද්‍යාන කටයුතු හා කාර්යයන් පරිපාලනය කිරීම, කළමනාකරණය සහ මෙම පනත යටතේ කටයුතු පැවැරුනු නිත්‍ය හෝ නිත්‍ය ලෙස හෝ තාවකාලිකව අනුයුක්ත කාර්යය මණ්ඩල පරිපාලනය හා කළමනාකරණය කිරීමට අදාළ මෙම පනතේ කාර්යයන් සඳහා -
	(අ). ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයා වීමට හෝ ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයා වශයෙන් වැඩ බැලීමට තැනැත්තෙකු;	අ. උප වගන්තිය ඉවත් කර පහත සඳහන් නව උප වගන්තිය එකතු කිරීමෙන්.	අ. ජාතික සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු;
	(ආ) ජාතික සත්ව උද්‍යාන පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් වීමට හෝ ජාතික සත්ව උද්‍යාන පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් වශයෙන් වැඩ බැලීමට තැනැත්තන් ;	ආ. උප වගන්තිය ඉවත් කර පහත සඳහන් නව උප වගන්තිය එකතු කිරීමෙන්.	ආ. ජාතික සත්වෝද්‍යාන අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් අවශ්‍යතාවය අනුව ;
	(ඇ) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් එවැනි නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය යුතු ය.	ඇ. එලෙසම.	ඇ. මේ පනතේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් එවැනි නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය යුතු ය.
	2. 2. මේ පනතේ කාර්ය සඳහා පත්කරනු ලබන සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති	2. (2). උප වගන්තිය ඉවත් කර පහත සඳහන් නව උප වගන්තිය එකතු කිරීමෙන්.	2. (2). මේ පනතේ කාර්යය සඳහා පත් කරනු ලබන සියලු නිලධරයන් සහ සේවකයන්

(2)	සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ නිලධරයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.	2. (2). උප වගන්තියට ඉක්බිතිව 2. (3). නව උපවගන්තිය එකතු කිරීම.	දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යය සඳහා රජයේ නිලධරයන් හා 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ අර්ථානුකූලව සාම නිලධරයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය. 2.(3). 2.(1). උප වගන්තිය යටතේ පත් කරනු ලබන යම් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් අතරින් යම් අයෙකු මෙම පනත යටතේ පිහිටවනු ලබන සත්වෝද්‍යානයක භාරකරු වශයෙන් යම් නිලධරයන් ද, නියෝජ්‍ය භාරකරුවන් වශයෙන් නිලධරයන් ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලැබීම හා නිශ්චිත කාර්යය පැවරීම කල යුතු ය.
	I වන කොටස **ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය කාර්යය හා බලතල**	**I වන කොටස** **" ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයාගේ " යන වචන ඉවත් කර " ජාතික සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ" යන වචන ආදේශ කිරීමෙන්.**	**I වන කොටස** **ජාතික සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය කාර්යය හා බලතල**
3.(1)	(මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික සත්ව උද්‍යාන අධ්‍යක්ෂවරයා, (මෙහි මින් මතු "සත්ව උද්‍යානය"යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික සත්ව උද්‍යානයේ කටයුතු සහ කාර්ය අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.	ප්‍රධාන පනතේ 3.(1) උප වගන්තිය ඉවත් කර පහත සඳහන් නව උප වගන්තිය ආදේශ කිරීම.	3.(1) මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහි මින් මතු ජාතික "සත්වෝද්‍යාන" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික සත්වෝද්‍යාන සියලු කටයුතු හා කාර්යය කළමනාකරණය සහ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු අතර, ඊට අදාළ බලය ද දරන්නේ ය.
(2)	(1) වන උප වගන්තියේ කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා විසින්, සත්ව උද්‍යානයේ නියෝජ්‍ය	3.2. උප වගන්තිය ඉවත් කර, පහත සඳහන් 3.(2).. 3.(3).. සහ 3.(4).. නව උප වගන්ති	3.(2). 3.(1) වන උප වගන්තියේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අතිරේක

	හෝ සහකාර අධ්‍යක්ෂවරයෙකු හෝ වෙනත් යම් නිලධරයෙකු වෙත ස්වකීය බලතල අතුරින් කිසිවක් පවරනු ලැබිය හැකි ය.	එකතු කිරීමෙන්	අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ හෝ වෙනත් යම් නිලධරයකු වෙත ස්වකීය බලතල අතුරින් කිසිවක් පවරනු ලැබිය හැකි ය. 3.(3). මෙම පනත යටතේ ආවරණය සැලසෙන සත්වෝද්‍යාන කළමනාකරණය, පාලනය, මෙහෙයවීම හා ඊට අදාළ විය හැකි අනෙකුත් කරුණු ආවරණය වන පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් කළමනාකරණ සැලැස්මක් පිළියෙල කල යුතු ය. 3.(4). 3.(3). උපවගන්තිය යටතේ පිළියෙල කරනු ලබන කළමනාකරණ සැලැස්මකට ඇතුළත් කිරීමට නියමිත කරුණු සහ එම සැලැස්ම පිළියෙළ කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය හා කළමනාකරණ සැලැස්ම බලාත්මක කිරීම පිළිබඳ නියම කරමින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

4.	අධ්‍යක්ෂවරයා විසින් : (අ) කොරටු මාවත්, ගොඩනැගිලි හා වැටවල් ඉදිකිරීම, ජල ප්‍රමාණයන් සැකසීම සහ සත්ව උද්‍යානයේ පාලනය සඳහා අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන වෙනත් වැඩ කිරීම සඳහා ; (ආ) සත්ව උද්‍යානයේ සිටින සතුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ; (ඇ) වාහන ගමනාගමනය විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා ; (ඈ) වාහන නවතා තැබීම පිණිස විශේෂ පෙදෙස් සැපයීම සඳහා ; (ඉ) සත්ව උද්‍යානය බැලීමට පැමිණෙන අමුත්තන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ; සහ (ඊ) සත්ව උද්‍යානය විසින් පවත්වාගෙන යනු ලබන යම් ගොවිපළක් සහ ඒහි නිෂ්පාදන සුරැකීම සඳහා	ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වගන්තිය ඉවත් කර පහත සඳහන් නව 4 නව වගන්තිය ආදේශ කිරීම.	4. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අ. සත්වෝද්‍යාන සතු සතුන්ගේ සුභසාධනය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ; ආ. සත්වෝද්‍යාන තුළට පැමිණෙන හා ඒ තුළ රැඳී සිටින අමුත්තන්ගේ සහ කාර්යය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා; ඇ. දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ත්ව විශේෂවල, ජාන සංයුතිය ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සඳහා වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනතට අනුකූලව දේශීය හෝ විදේශීයව සතුන් ලබා ගැනීම හා එවැනි වැඩපිළිවෙල යටතේ සතුන් හුවමාරු කිරීම සඳහා; ඈ. දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ත්ව විශේෂ හා පර්යටන සත්ත්වයන් සඳහා අභිජනන, රැඳවුම් මධ්‍යස්ථාන හා සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ ඔවුන් සුරක්ෂිත කිරීමේ කාර්යයන් සඳහා ජාන සම්පත් සුරැකීමේ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා; ඉ. සත්වෝද්‍යාන තුළ දේශීය අතිරික්ත සතුන් සහ පරිබාහිර සංරක්ෂණය වෙනුවෙන් අභිජනනය කිරීමෙන් ලැබෙන්නා වූ සතුන් ඒ සඳහා වූ සම්මත ක්‍රමවේදයන් අනුගමනය කරමින්, අදාළ බලධාරියෙකුගේ අවසරය හෝ එකඟතාවය මත සුදුසු පරිසර සඳහා මුදා හැරීම, හඳුන්වාදීම, නිදහස් කිරීම සඳහා;

			ඊ. සත්වෝද්‍යාන හෝ මෙම පනතේ කාර්යයන් සඳහා අවශ්‍ය කරන සතුන්ට උචිත වූ පරිසර තත්ත්වයන් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වූ වනජ ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍යයන් අවශ්‍යතාවය අනුව, අදාළ බලධාරියකුගේ අවසරය හෝ එකඟතාවය මත ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසරයෙන් හෝ විදේශීයව ලබා ගැනීම සඳහා; එ. අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා වූ ජීවී හෝ අජීවී සත්ත්ව නිදර්ශක එකතුවක් පවත්වා ගැනීම සඳහා; ඒ. කිසියම් විශේෂ දිනයක දී හෝ සතෙකු පලා යාම හෝ යම් නොසන්සුන් වතාවරණයක් හෝ ස්වභාවික ව්‍යසනයක් වැනි විශේෂ අවස්ථාවක දී සතුන්ගේ, අමුත්තන්ගේ සහ කාර්යය මණ්ඩලයේ සහ දේපලවල ආරක්ෂාව සඳහා යම් සත්වෝද්‍යානයක් හෝ සත්වෝද්‍යානයක යම් නිශ්චිත ප්‍රදේශයක් වසා දැමීමට හා රැඳී සිටින තැනැත්තන් ඉවත් කිරීමට, ආරක්ෂිත ස්ථානයන්හි රැඳවීමට හෝ විවෘත නොකිරීම සඳහා; ඓ. යම් සත්වෝද්‍යානයක, සත්වෝද්‍යාන තුළ යම් අයෙකුගේ ජීවිත අවදානමකට ලක්ව ඇති අවස්ථාවක එම අවදානම වලක්වා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව සැලසීම සඳහා; ඔ. සත්වෝද්‍යාන කළමනාකාරිත්වය සඳහා අවශ්‍ය යැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන පරිදි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය සියලු පහසුකම් සහිත යටිතල පහසුකම් සැලසීම සඳහා;

			ඕ. සත්වෝද්‍යාන තුළ වාහන ගමනාගමනය හා නවතා තැබීම විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා; ඖ. සත්වෝද්‍යානයන්හි රඳවා සිටින සතුන්ට අවශ්‍ය ආහාර ලබා ගැනීමට පවත්වා ගෙන යනු ලබන යම් ගොවිපලක් පිහිටුවීම, පරිපාලනය කිරීම, මෙහෙයවීම සහ කළමනාකරණය සඳහා; ක. අවස්ථානුකූලව සතුන් සඳහා සුවදායී මරණය සම්බන්ධයෙන් පශුවෛද්‍ය නිර්දේශය මත තීරණ ගැනීම සඳහා;
	සත්ව උද්‍යානය ඇතුළත පියවර ගනු ලැබිය හැකි ය.	"සත්ව උද්‍යානය ඇතුළත පියවර ගනු ලැබිය හැකි ය" වගන්තිය ඉවත් කිරීමෙන් පහත වගන්තිය ආදේශ කිරීම	සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පියවර ගනු ලැබිය හැකි ය.
5.(1)	(අ) නියමිත ගාස්තුව ගෙවීම මත සත්ව උද්‍යානයේ දොරටුවේ දී නිකුත් .කරනු ලබන වලංගු ප්‍රවේශ පත්‍රයක් නොමැතිව සත්ව උද්‍යානයට ඇතුළුවන; (ආ) අධ්‍යක්ෂවරයා විසින් හෝ යම් නියෝජ්‍ය හෝ යම් සහකාර අධ්‍යක්ෂවරයෙකු විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ විට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ ඒසේ කිරීමට අසමත් වන;	5 වගන්තිය ඉවත් කර 5 නව වගන්තිය ඇතුළත් කිරීම.	5.(1).අ. නියමිත ගාස්තුව ගෙවීම මත සත්වෝද්‍යාන දොරටුවේ දී නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් නොමැතිව සත්වෝද්‍යාන තුළට ඇතුළුවන; ආ. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විධිමත් ලෙස බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් ඉල්ලා සිටිනු ලැබූ විට තම අවසර පත්‍රය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන හෝ ඒසේ කිරීමට අසමත් වන;

	(ඇ) වෙනත් යම් තැනැත්තෙකුට සත්ව උද්‍යානයට ඇතුළු වීමට හැකි වනු පිණිස තමා වෙත නිකුත් කරනු ලැබූ ප්‍රවේශ පත්‍රය විකුණන හෝ පවරන හෝ විකිණීමට හෝ පැවරීමට උත්සාහ කරන;		ඇ. වෙනත් යම් තැනැත්තෙකුට සත්වෝද්‍යාන තුළට ඇතුළු වීමට හැකි වනු පිණිස තමා වෙත නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය විකුණන හෝ පවරන හෝ විකිණීමට හෝ පැවරීමට උත්සාහ කරන;
			ඈ. සත්වෝද්‍යාන විසින් භාවිතා කරන අවසර පත්‍ර හෝ සත්වෝද්‍යාන ඇතුළත ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරනු ලබන ප්‍රවේශ පත්‍ර වංචනික ලෙස මුද්‍රණය කිරීම, ළඟ තබා ගැනීම, විකිණීම හෝ භාවිතා කිරීම.
	(ඈ) සත්ව උද්‍යානය ඇතුළත යම් සතෙකුට කෑම සැපයීම දැන්වීමක් මගින් තහනම් කරනු ලැබ ඇති යම් ප්‍රදේශයක සිටින යම් සතෙකුට කෑම සැපයීමෙහි නිරතව සිටින;		ඉ. සත්වෝද්‍යාන ඇතුළත යම් ප්‍රදේශයකට ඇතුළු වීම දැන්වීමක් මගින් තහනම් කරනු ලැබ ඇති යම් ප්‍රදේශයකට අවසර නොමැතිව ඇතුළු වන;
	(ඉ) සත්ව උද්‍යානය ඇතුළත, යම් ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ වෙනත් යම් ශබ්දෝපකරණයක් පාවිච්චි කිරීම දැන්වීමක් මගින් තහනම් කරනු ලැබ ඇති යම් ප්‍රදේශයක එවැනි ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ ශබ්දෝපකරණයක් පාවිච්චි කරන;		ඊ. සත්වෝද්‍යාන ඇතුළත යම් සතෙකුට ආහාර සැපයීමට අවසරයක් ලබා දී ඇත්නම් මිස සත්වෝද්‍යානයක සිටින යම් සතෙකුට ආහාර සැපයීම හෝ එසේ කිරීමට උත්සාහ කරන හෝ යම් ද්‍රව්‍යයක් ආහාර සඳහා ලබා දීමේ නිරතව සිටින;
	(ඊ) අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සත්ව උද්‍යානය ඇතුළත ඡායාරූපි උපකරණ පාවිච්චි කරන ;		උ. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතියක් නොමැතිව සත්වෝද්‍යාන පරිශ්‍රයට යම් සතෙකු රැගෙන එන, සත්වෝද්‍යාන පරිශ්‍රය තුළ රැගෙන සංචාරය කරන හෝ රඳවා තබා ගන්නා;
	(උ) අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව සත්ව උද්‍යානය තුළට යම් සතකු කැටුව යන;		ඌ. සත්වෝද්‍යාන ඇතුළත යම් සතෙකුට සරදම් කරන, පීඩා කරන, බාධා පමුණුවන, හිරිහැර කරන, හෝ තුවාල කරන නැතහොත් ප්‍රදර්ශනයට තබා ඇති යම් සතෙකුගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට යම් විධියකින් හානි කරවන වෙනත් යම් ආකාරයකින් ක්‍රියා කරන;
	(ඌ) සත්ව උද්‍යානය ඇතුළත තුවක්කුවක්, පනොරොමක්, යම් වෙඩි උපකරණයක් හෝ යම් විස්තරයක වෙනත් පුපුරණ ද්‍රව්‍යක් ගෙන යන		

	හෝ තම සන්තකයේ හෝ තම පාලනය යටතේ තබා ගෙන ඇති;		උ. මෙම පනත යටතේ යම් සතෙකු හෝ සතුන් රඳවා තබා සිටින යම් පෙදෙසක් තුළට යම් ද්‍රව්‍යක් බැහැර කරන;
	(එ) යම් තුවක්කුවක් පත්තු කරන හෝ පත්තු කිරීමට තැත් කරන හෝ පුපුරණ ද්‍රව්‍ය කිසිවක් පාවිච්චි කරන;		ඌ. සත්වෝද්‍යාන පරිශ්‍රය තුළ කිසියම් තුවක්කුවක්, ගිනි අවියක්, යම් වෙඩි උපකරණයක්, පතරොමක් හෝ වෙනත් පුපුරණ ද්‍රව්‍යක්, හෝ යම් විෂ ද්‍රව්‍යක් රුගෙන යාම හෝ සන්තකයේ තබා ගැනීම හෝ පාලනය යටතේ තබා ගැනීම හෝ භාවිතා කරන;
	(ඒ) සත්ව උද්‍යානය ඇතුළත යම් ප්‍රදේශයකට ඇතුළු වීම, දැන්වීමක් මගින් තහනම් කරනු ලැබ ඇති යම් ප්‍රදේශයකට ඇතුළු වන;		ඔ. සත්වෝද්‍යාන ඇතුළත, යම් ශබ්දෝපකරණයක් පාවිච්චි කිරීම සඳහා අවසරයක් ලබා දී නොමැතිනම්, එවැනි ශබ්දෝපකරණයක් පාවිච්චි කරන;
	(ඔ) සත්ව උද්‍යානය ඇතුළත යම් සතෙකුට සරදම් කරන, පීඩා කරන, බාධා පමුණුවන, හිරිහැර කරන, හෝ තුවාල කරන නැතහොත් ප්‍රදර්ශනයට තබා ඇති යම් සතකුගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට යම් විධියකින් හානි කරවන වෙනත් යම් ආකාරයකින් ක්‍රියා කරන;		
	(ඕ) සත්ව උද්‍යානය ඇතුළත සත්ව උද්‍යානයේ යම් සේවානියුක්තයකුට අවහිර කරන, තර්ජනය කරන හෝ ඔහුට බාධා කරන;		ඕ. සත්වෝද්‍යානවලට අයත් ජීවී හෝ අජීවී යම් දේපලක් ඉවත් කරන හෝ ඊට හානි පමුණුවන;
	(ක) සත්ව උද්‍යානයට අයත් යම් දේපළක් ඉවත් කරන හෝ ඊට හානි පමුණුවන;		ක. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සපයනු ලැබ ඇති වාහන නැවතුම් පෙදෙස් වලින් බාහිරව වාහනයක් නවත්වා තබන;
	(ග) අධ්‍යක්ෂවරයා විසින් සපයනු ලැබ ඇති වාහන නැවතුම් පෙදෙස් වලින් පිටත වාහනයක් නවත්වා තබන;		ග. සත්වෝද්‍යාන ඇතුළත මෝටර් වාහන පැදවීම තහනම් කරනු ලැබ ඇති යම් පෙදෙසක මෝටර් වාහනයක් පදවන;

	(ච) අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව සත්ව උද්‍යානය ඇතුළත යම් අත් පත්‍රිකාවක්, විශාල දැන්වීමක්, පෝස්ටරයක්, දැන්වීමක් හෝ එවැනි යම් ලේඛනයක් බෙදා හරින හෝ ප්‍රදර්ශනය කරන, (ජ) සත්ව උද්‍යානය ඇතුළත මෝටර් වාහන පැදවීම තහනම් කරනු ලැබ ඇති යම් පෙදෙසක මෝටර් වාහනයක් පදවන ; සහ (ට) අධ්‍යක්ෂවරයාගේපූර්ව අනුමතය නොමැතිව සත්ව උද්‍යානය ඇතුළත යම් භාණ්ඩයක් විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.		ච. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව සත්වෝද්‍යාන පරිශ්‍රය තුළ, පිවිසුම් ආසන්නයේ යම් අත් පත්‍රිකාවක්, දැන්වීමක්, පෝස්ටරයක්, ඩිජිටෙල් පුවරු දැන්වීම්, හෝ එවැනි යම් ලේඛනයක්, ඩිජිටෙල් මෙවලම් හෝ උපකරණ බෙදා හරින හෝ ප්‍රදර්ශනය කරන; ජ. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව සත්වෝද්‍යාන ඇතුළත යම් භාණ්ඩයක් විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන; ට. මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය හා කර්තවය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී පනතේ 2.(1).අ , 2.(1)ආ සහ 2.2. යටතේ බලය ලබා දී ඇති සේවා නියුක්තියකුට තර්ජනය කරන, බිය ගන්වන, පහර දෙන බාධා කරන හෝ යම් ආකාරයකින් ඔහුගේ කටයුතු වලට මැදිහත් වන; ඩ. සත්වෝද්‍යාන පරිශ්‍රය තුළ නියම කර ඇති ආකාරයෙන් පරිබාහිරව අපද්‍රව්‍යයන් බැහැර කරන; යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2)	(1) වන උප වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තෙකුම, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.	පනතේ 5.2. උප වගන්තිය ඉවත් කර 5.(2)., 5.(3)., 5.(4). සහ 5.(5). නව උප වගන්ති එකතු කිරීම,	5.(2). 5.1 උප වගන්තිය යටතේ ගැනෙන වරදක් වූ, වරදක් කිරීමට ඉඩ සලස්වන, ආධාර හෝ අනුබල දෙන නැතහොත් ඒ සඳහා ඉඩ සලස්වන, සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු විය යුතු ය. 5.(3). 5.1 හෝ 5.(2) උප වගන්ති යටතේ වරදක් හෝ ඉහතින් කෙසේ සඳහන් වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පැවරූ නිලධාරියෙකු විසින් ලබා දුන් අවසරයක් මත හෝ එවැනි නිලධාරියෙකුගේ නියමයක් මත යම් නිශ්චිත කාර්යයක නිරත වන අයෙකු මෙම වගන්ති යටතේ වරදක් කරනු ලැබුවෙකු ලෙස නොසැලකිය යුතු ය. 5.(4). 5. (1) වන හා 5.(2) වන උප වගන්ති යටතේ ගැනෙන වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තෙකු රුපියල් පන්දහසකට (රුපියල් 5000/-) නොඅඩු රුපියල් ලක්ෂ පහක් (රුපියල් 500,000/-) නොඉක්මවන දඩයකට හෝ මාස තුනකට නොඅඩු අවුරුදු පහකට නොවැඩි සිරදඬුවමකට හෝ දඩය හා සිරදඬුවම යන දණ්ඩනයන් දෙකටම යටත් විය යුතු ය. මීට අමතරව, වරදකට වරදකරු කරනු ලැබූ තැනත්තෙකු රජයට අලාභයක් කර ඇති විටක එම අලාභයට සරිලන වන්දියක් නියම කළ හැකි ය. එලෙස වන්දියක් නියම කර ඇති අවස්ථාවක එය දණ්ඩනයක් ලෙස අය කර ගත යුතු ය.

			5.(5). ඉහත උප වගන්ති යටතේ වන්දි පිළිගත් යම් අවස්ථාවක දී -: අ. යම් දේපලක් තහනමට ගෙන තිබේ නම් සහ ඒ දේපල රජයට අයත් නොවේ නම්, ඒ දේපල වරදකරු වෙත මුදාහැරිය යුතු ය. ආ. වරදකරු අත්අඩංගුවෙහි සිටී නම්, ඔහු නොපමාව නිදහස් කළ යුතු අතර, ඒ තැනැත්තාට හෝ දේපලවලට විරුද්ධව වැඩි දුරටත් නඩු කටයුත්ත ආරම්භ කිරීම නොකළ යුතු ය.
6 (1)	5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ යම් වරදක්, රුපියල් සියයක් නොඉක්මවන මුදලක් භාරගැනීමෙන් සිදු කරන ලද වරද බේරුම් කිරීමේ ආකාරයෙන් අධ්‍යක්ෂවරයා විසින්, කවර වූ හෝ අවස්ථාවක, සමථයකට පත් කරනු ලැබිය හැකිය. තවද, එවැනි යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට විරුද්ධව නඩුවක් පවරනු ලැබ ඇති විට ඒ නඩුව විනිශ්චයට භාජනව ඇත්තේ යම් අධිකරණයක් ඉදිරියේද ඒ අධිකරණයේ කැමැත්ත ඇතිව නඩු තීන්දුවට පෙර, යම් අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ වරද සමථයකට පත්කොට ඒ නඩුව පැවරීම අස් කර ගත හැකි ය.	පනතේ 6.(1) උප වගන්තිය ඉවත් කර පහත සඳහන් නව උප වගන්තිය එකතු කිරීම.	6.(1). 5 වන වගන්තියේ 5.(1).ඌ., 5.(1).ඕ., 5.(1).ට. උපවගන්ති යටතේ වන වරදක් හෝ එවැනි වරදක් කිරීමට සැලසීම හෝ ඊට අධාර අනුබල දීම හෝ නොවන යම් වරදක් කර ඇතැයි යුක්ති සහගතව සැක කරනු ලැබූ යම් තැනැත්තකු, කරනු ලැබිය හැකි වූ වරදට වන්දි වශයෙන් මුදල් ප්‍රමාණයක් පිළිගැනීම, ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් කළ හැකි ය.
(2)	අධ්‍යක්ෂවරයා විසින (1) වන උපවගන්තිය යටතේ භාරගනු ලබන මුදල. මේ පනත යටතේ පිහිටුවනු ලැබූ සත්ව උද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලට බැර කළ යුතුය.	පනතේ 6.2.උපවගන්තියේ "අධ්‍යක්ෂවරයා" වෙනුවට "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යෙදීම, "සත්ව උද්‍යාන" වෙනුවට "සත්වෝද්‍යාන" යන වචන යෙදීම,	6.(2). අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 6.(1) වන උප වගන්තිය යටතේ භාරගනු ලබන මුදල, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලට බැර කළ යුතු ය.

		පනතේ 6.2. උප වගන්තියට පසුව පහත සඳහන් 6.(3)., 6.(4)., නව උප වගන්ති ඇතුලත් කිරීම,	6.(3). මේ පනතේ කාර්යයන් සඳහා සත්වෝද්‍යාන සතු යම් දේපලක අනන්‍යතාවය හෝ වටිනාකම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සනින් නිකුත් කරනු ලබන සහතිකයක්, ඒ පිළිබඳ පැවැත්වෙන යම් නීති කෘත්‍යකදී හෝ වෙනත් යම් කටයුත්තක දී, පටහැනි කරුණු ඔප්පු කරනු ලබන තෙක් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් සේ ආවේශ කරනු ලැබිය යුතු අතර, එය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.
7.	යම් වරදකරුවකු වරදකට වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියේ ද, ඒ අධිකරණය විසින්, ඒ වරද සඳහා යම් දඩයක් පනවනු ලබන්නේ ද, එයින් එක් අඩක් නොඉක්මවන්නා වූ යම් කොටසක් හෝ සැබවින්ම අයකර ගනු ලබන්නා වූ යම් මුදල් ප්‍රමාණයකින් එක් අඩක් නොඉක්මවන්නාවූ යම් කොටසක් හෝ, මේ පනත යටතේ පිහිටවනු ලැබූ සත්ව උද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදලට ප්‍රදානය කිරීමට නියම කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.	ප්‍රධාන පනතේ 7 වන වගන්තියට පෙරාතුව 7. (1). උප වගන්තිය ලෙස නම් කර, එම නව උප වගන්තිය එකතු කිරීම.	7.(1). මෙම පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් අධිකරණය විසින් නියම කරනු ලැබූ යම් දඩයකින් අඩකට නොඅඩු වූ මුදලක් සත්වෝද්‍යාන සංවර්ධන සහ සුභ සාධක අරමුදලට බැර මුදලට කල යුතු ය.
		ප්‍රධාන පනතේ 7 වන වගන්තිය 7. (2). උප වගන්තිය ලෙස නම් කර, එම වගන්තියේ " අඩක් නොඉක්මවන්නා" වචන ඉවත් කර ඒ වෙනුවට "අඩකට නොඅඩු" යන වචන එකතු කිරීම.	7. (2). යම් වරදකරුවකු වරදකට වරදකරු කරනු ලැබුවේ යම් අධිකරණයක් ඉදිරියේ ද, ඒ අධිකරණය විසින්, ඒ වරද සඳහා යම් දඩයක් පනවනු ලබන්නේ ද, දඩය වශයෙන් අයකර ගනු ලබන සම්පූර්ණ මුදල් ප්‍රමාණය හෝ එයින් එක් අඩකට නොඅඩු වූ යම් කොටසක් හෝ සැබවින්ම අයකර ගනු ලබන්නා වූ යම් මුදල් ප්‍රමාණයකින් එක් අඩකට නොඅඩු වූ යම්

			කොටසක් හෝ, මේ පනත යටතේ පිහිටවනු ලැබූ සත්වෝද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදලට ප්‍රදානය කිරීමට නියම කරනු ලැබිය යුතු ය.

01-ix

II වන කොටස -සත්ව උද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදල

8(1)	මෙ පනතේ කාර්යය සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ව උද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.	එලෙසම.	8. (1) මෙ පනතේ කාර්යය සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්වෝද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.
(2)	(අ) කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග වශයෙන් ලැබිය හැකි සියලු මුදල්;	එලෙසම.	8.(2). අ. කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග වශයෙන් ලැබිය හැකි සියලු මුදල්;
	(ආ) 6 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂකවරයා විසින් අයකර ගනු ලැබිය හැකි සියලු මුදල්;	පනතේ 8.(2)ආ. උප වගන්තියේ "අධ්‍යක්ෂකවරයා" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචනය යෙදීමෙන්.	ආ. 6 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයකර ගනු ලැබිය හැකි සියලු මුදල්;
	(ඇ) දඩ මුදල් වශයෙන් අයකර ගනු ලැබිය හැකි සියලු මුදල් ;	එලෙසම.	ඇ. දඩ මුදල් වශයෙන් අයකර ගනු ලැබිය හැකි සියලු මුදල්;
	(ඈ) උද්‍යාන නිෂ්පාදන විකිණීමෙන් ලබා ගත හැකි සියලු මුදල්; සහ	පනතේ 8.(2)ඈ. උප වගන්තියේ "උද්‍යාන" යන වචනය ඉවත් කර ඒ වෙනුවට "සත්වෝද්‍යාන" යන වචනය යෙදීමෙන්.	ඈ. සත්වෝද්‍යාන නිෂ්පාදන විකිණීමෙන් ලබා ගත හැකි සියලු මුදල්; සහ
	(ඉ) කවර වූ හෝ ප්‍රභවයකින් යම් ආදායමක් වශයෙන් ලැබූ වෙනත් සියලු මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතුය.	එලෙසම.	ඉ. කවර වූ හෝ ප්‍රභවයකින් යම් ආදායමක් වශයෙන් ලැබූ වෙනත් සියලු මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.
(3)	පහත දැක්වෙන මුදල්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතියට යටත්ව, අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.	එලෙසම.	(3). පහත දැක්වෙන මුදල්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතියට යටත්ව, අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

	(අ) සත්ව උද්‍යානයට පැමිණෙන අමුත්තන්ට අනුයාත සේවා සැලසීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල්;	පනතේ 8.(3)අ. උප වගන්තියේ "සත්ව උද්‍යානයට" යන වචනය ඉවත් කර, ඒ වෙනුවට "සත්වෝද්‍යාන සඳහා" යන වචන යෙදීමෙන්.	අ. සත්වෝද්‍යාන සඳහා පැමිණෙන අමුත්තන්ට අනුයාත සේවා සැලසීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල්;
	(ආ) සත්ව උද්‍යානයේ සේවා නියුක්තයන්ට සුභ සාධන සහ දිරි ගැන්වීමේ යෝජනා ක්‍රම සැලැස්වීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ; සහ	පනතේ 8.(3)ආ. උප වගන්තියේ "සත්ව උද්‍යානයේ" යන වචනය ඉවත් කර, ඒ වෙනුවට "සත්වෝද්‍යාන" යන වචනය යෙදීමෙන්.	ආ. සත්වෝද්‍යාන සේවා නියුක්තයන්ට සුභ සාධන සහ දිරි ගැන්වීමේ යෝජනා ක්‍රම සැලැස්වීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ; සහ
	(ඇ) නිශ්චිත වශයෙන් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනතේ කාර්යය සඳහා අවශ්‍ය සියලු වියදම්.	එලෙසම.	ඇ. නිශ්චිත වශයෙන් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනතේ කාර්යය සඳහා අවශ්‍ය සියලු වියදම්.
(4)	අධ්‍යක්ෂවරයා අරමුදලේ පරිපාලනය සඳහා වගකිව යුතු ය.	පනතේ 8.(4) උප වගන්තියේ "අධ්‍යක්ෂකවරයා" යන වචනය ඉවත් කර, ඒ වෙනුවට "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචනය යෙදීමෙන්.	8.(4). අධ්‍යක්ෂ ජනරාල්වරයා අරමුදලේ පරිපාලනය සඳහා වගකිව යුතු ය.
(5)	අරමුදලේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.	එලෙසම.	8.(5). අරමුදලේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.
		පනතේ 8.(5). උප වගන්තියට ඉක්බිතිව පහත සඳහන් 8.(6). නව උප වගන්තිය එකතු කිරීම;	8.(6).අ. මෙම පනතට අදාළ රාජකාරියක නියුක්තව සිටිය දී හෝ එවැනි රාජකාරියක නියැළී සිටි බවට නිශ්චිතවම තහවුරු කර ගත හැකි අවස්ථාවක දී, 2.(1).අ , 2.(1) ආ සහ 2.2. යටතේ බලය ලබා දී ඇති සේවා නියුක්තිකයෙකු අබලතාවයකට, නොහැකියාවකට හෝ මරණයට පත් වූවහොත්, සේවා නියුක්තිකයාට හෝ නෛතික උරුමකරුවන්ට වන්දි ප්‍රදානය කිරීම සඳහා අරමුදල භාවිතා කල යුතු ය.

			8.(6).ආ. ඉහත 8.(6).අ. උප වගන්තිය යටතේ සඳහන් වන්දිය අබලතාවය, නොහැකියාව හෝ මරණය සම්බන්ධයෙන්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හෝ ඒ සඳහා අදාළ වනු ලබන වෙනත් අන් ලිඛිත නීතියක් හෝ යටතේ ප්‍රදානය කරනු ලබන වන්දියකට අමතරව විය යුතු ය. 8.(6).ඇ. ඉහත 8.(6).අ. උප වගන්තිය යටතේ සඳහන් අබලතාවය, නොහැකියාව හෝ මරණය සම්බන්ධයෙන් වන්දි වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය නිශ්චිත නිර්ණායකවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කිරීම නීත්‍යානුකූල විය යුතු ය. ඊට අදාළ නිර්ණායක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද කමිටුවක් මඟින් සකස් කල යුතු ය.

	III වන කොටස - විවිධ		
9(1)	සත්ව උද්‍යානය සම්බන්ධයෙන් වූ සියලු කාරණා හා ප්‍රශ්න පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් දීමේ සහ අමාත්‍යවරයා වෙත නිර්දේශයන් කිරීමේ කාර්යය සඳහා සභාපතිවරයා වශයෙන් අධ්‍යක්ෂවරයාගෙන් ද, වෙනත් තැනැත්තන් එකොළොස් දෙනකුගෙන් ද සමන්විත වන්නා වූ උපදේශක කාරක සභාවක් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකි ය.	ප්‍රධාන පනතේ 9 වගන්තිය ඉවත් කර, පහත සඳහන් නව වගන්තිය එකතු කිරීම.	9. සත්වෝද්‍යානයේ කර්තව්‍යයන් ඉටු කිරීමේ දී, අවස්ථානෝචිතව යම් යම් නිශ්චිත කරුණු සම්බන්ධයෙන් නිර්දේශ, උපදෙස් හෝ මඟ පෙන්වීම ලබා ගැනීම සඳහා සුදුසු පුද්ගලයින්ගෙන් සැදුම්ලත් කමිටුවක් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකි ය. එම කමිටුවේ සභාපතිවරයා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා වන්නේ ය.
9(2)	උපදේශක කාරක සභාවේ රැස්වීම, යටත් පිරිසෙයින්, සෑම වර්ෂයකදීම දෙවරක් පැවැත්විය යුතු ය.	ප්‍රධාන පනතේ 9.(2) සහ 9(3) වෙනි උප වගන්ති ඉවත් කිරීම.	
9(3)	විධිවිධාන නියම කර නොමැති යම් කාර්යය පටිපාටිමය කාරණයක් සම්බන්ධයෙන් ස්වකීය කාර්යය පටිපාටිය නිරණය කිරීමට උපදේශක කාරක සභාවට හිමිකම ඇත්තේ ය.		
10 (1)	සත්ව උද්‍යානයට පයත් දේපල බවට අදහස් කරනු ලැබූ කිසියම් සතෙකු යම් තැනැත්තකු විසින් තම රකවරණයේ හෝ සන්තකයේ තබාගනු ලැබ සිටින බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට යුක්ති සහගත හේතු ඇති අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් හෝ ඒ වෙනුවෙන් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් -	පනතේ 10 (1) උප වගන්තියේ "සතෙකු" යන්නට ඉක්බිතිව "හෝ ජීවී හෝ අජීවී සත්ත්ව කොටසක්" යන වචනය ඇතුළත් කිරීම සහ "අධ්‍යක්ෂකවරයා" යන වචනය ඉවත් කර, ඒ වෙනුවට "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචනය යෙදීමෙන්.	10.(1). සත්වෝද්‍යානයට අයත් දේපල බවට අදහස් කරනු ලැබූ කිසියම් සතෙකු හෝ ජීවී හෝ අජීවී සත්ත්ව කොටසක් යම් තැනැත්තකු විසින් තම රකවරණයේ හෝ සන්තකයේ තබාගනු ලැබ සිටින බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට යුක්ති සහගත හේතු ඇති අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඒ වෙනුවෙන් ලියවිල්ලකින් බලය දෙනු ලැ යම් තැනැත්තෙකු විසින් -

	(අ) එවැනි සතෙකු සිටිය හැකි යයි විශ්වාස කිරීමට තමාට යුක්ති සහගත හේතු ඇත්නම් යම් ස්ථානයකට හෝ වාහනයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම ; සහ	පනතේ 10 (1) (අ) උප වගන්තියේ "සතෙකු" යන්නට ඉක්බිතිව "හෝ ජීවී හෝ අජීවී සත්ත්ව කොටසක්" යන වචනය ඇතුළත් කිරීම	අ. එවැනි සතෙකු හෝ ජීවී හෝ අජීවී සත්ත්ව කොටසක් තිබිය හැකි යයි විශ්වාස කිරීමට තමාට යුක්ති සහගත හේතු ඇත්නම් යම් ස්ථානයකට හෝ වාහනයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම ; සහ
	(ආ) ඒ සතාගේ සන්තකය ආපසු ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.	පනතේ 10 (1) (ආ) උප වගන්තියේ "සන්තකය" යන්නට ඉක්බිතිව "හෝ ජීවී හෝ අජීවී සත්ත්ව කොටසක්" යන වචනය ඇතුළත් කිරීම.	ආ. ඒ සතාගේ සන්තකය හෝ ජීවී හෝ අජීවී සත්ත්ව කොටසක් සන්තකය ආපසු ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.
10(2)	(1) වන උප වගන්තියේ නියමයන් අනුව යම් සතෙකු ඉවත් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ රැකවරණයේ සිට ද, ඒ තැනැත්තා, එම සතාගේ සන්තකය නැවත ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම සතා තමාට අයිති බව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා සතු වන්නේ ය.	එලෙසම.	10. (2). 10. (1) වන උප වගන්තියේ නියමයන් අනුව යම් සතෙකු ඉවත් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ රැකවරණයේ සිට ද, ඒ තැනැත්තා, එම සතාගේ සන්තකය නැවත ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එම සතා තමාට අයිති බව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා සතු වන්නේ ය.
		පනතේ 10.(2). උපවගන්තියට පසු 10.(3). නව උප වගන්තිය එකතු කිරීම.	10. (3). මෙලෙස භාරයට ගනු ලැබූ යම් සතෙකු හෝ සතුන් සත්වෝද්‍යාන නිලධාරියෙකු භාරයේ රඳවා තබා ගන්නා විටක එසේ තාවකාලිකව රඳවා ගනු ලබන නිශ්චිත භූමියට හා අදාළ සතුන් සම්බන්ධයෙන් මෙම පනතේ විධිවිධාන අදාළ කර ගනු ලැබිය හැකි ය.

11	මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා යම් රජයේ නිලධරයෙකුට විරුද්ධව සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ පවරනු නොලැබිය යුතුය.	පනතේ 11 වගන්තියේ "අදහස් කරන ලද" යන්නට ඉක්බිතිව "හෝ නොකර හරින ලද" යන වචනය එකතු කිරීමෙන්.	11. මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් රජයේ නිලධරයෙකුට විරුද්ධව සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ පවරනු නොලැබිය යුතු ය.
12	මේ පනතින් තමා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කරන හෝ කාර්යය ඉටු කරන යම් තැනැත්තෙකුට පහර දෙන, බාධක පමුණුවන, තර්ජනය කරන, ඔහු බිය ගන්වන, ඔහුට පරභව කරන හෝ නින්දා කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට ඔහු රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.	පනතේ 12 වගන්තිය ඉවත් කර, පහත සඳහන් වගන්තිය එකතු කිරිම.	12. මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී යම් සත්වෝද්‍යාන නිලධරයෙකුට තර්ජනය කරන, ඔහු බිය ගන්වන, ඔහුට පහර දෙන, බාධා කරන හෝ යම් ආකාරයකින් ඔහුගේ කටයුතුවලට හා මැදිහත් වන යම් තැනැත්තෙකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනකට (03) නොඅඩු වූ ද අවුරුදු හතකට (07) නොවැඩි සිර දඩුවමකට හෝ රුපියල් පනස් දහසකට (රුපියල් 50,000/-) නොඅඩු වූ ද රුපියල් එක් ලක්ෂ පනස් දහසකට (රුපියල් 150,000/-) නොවැඩි වූ ද දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.
13 (1)	නියම කළ යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබූ යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.	පනතේ 13 වගන්තිය ඉවත් කර, පහත සඳහන් වගන්තිය එකතු කිරිම.	13.(1). අමාත්‍යවරයා විසින් සත්වෝද්‍යාන හෝ යම් සත්වෝද්‍යානයක නිශ්චිතව සඳහන් කොටසක් හෝ කොටස් හෝ ස්වාරක්ෂිත කලාපයක් හෝ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙනත් යම් භූමියක් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අරභයා හෝ මෙම පනත යටතේ නියම කල යුතු යැයි හඳුන්වා ගනු ලබන යම් කාර්යයක් හෝ වෙනත් ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය.

01-7ii

			අ. සත්වෝද්‍යාන පරිපාලනය හෝ කළමනාකරණය. ආ. මෙම පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන ස්වාරක්ෂක කලාපයක කටයුතු නියාමනය කිරීම. ඇ. කළමනාකරණ සැලැස්මට ඇතුළත් කිරීමට නියමිත කාරණා සහ එම කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළ යුතු ආකාරය හා කාර්ය පටිපාටි සකස් කිරීම. ඈ. සත්වෝද්‍යාන තිරසර කළමනාකරණයේ දී ජන කොටස්වල හා රාජ්‍ය නොවන අංශයේ සහභාගීත්වය ලබා ගැනීමේ කාර්යය සඳහා කළමනාකරණ ගිවිසුම් පිළියෙල කිරීම. ඉ. සත්වෝද්‍යාන කළමනාකරණය කිරීමට අදාළව ගිවිසුම්වලට ඇතුළත්වීම, එම ගිවිසුම් අවලංගු කිරීම, කොන්දේසි පැනවීම, ගාස්තු නියම කිරීම, ආරවුල් සමථයකට පත් කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම. ඊ. කළමනාකරණ හවුල්කරුවන් හා කොටස්කරුවන් අතර ප්‍රතිලාභ බෙදා හැරීමේ යාන්ත්‍රණයන් සකස් කිරීම. උ. සත්වෝද්‍යාන තුළ කරගෙන යනු ලබන ක්‍රියාකාරකම්වලට අදාළ කොන්දේසි හා ගාස්තු නියම කිරීම. ඌ. සත්වෝද්‍යානයක විද්‍යාත්මක පර්යේෂණ කිරීම සඳහා අවසර දෙනු ලබන ප්‍රදේශ සහ එකී පර්යේෂණ කිරීමේ දී යටත්වනු ලබන කොන්දේසි නියම කිරීම.

			ඔ. සත්වෝද්‍යාන සංවර්ධන හා සුභ සාධක අරමුදලට අමතර වශයෙන් ලැබෙන පරිත්‍යාග අදාළ පරිත්‍යාග කරනු ලබන පාර්ශවය එකඟතාවය පල කරනු ලබන කාර්යයන් සඳහා යෙදවීමට රාජ්‍ය භාණ්ඩාගාරයේ ලිඛිත අනුමැතිය සහිතව පිහිටවනු ලබන විශේෂිත ගිණුමක තැනපත් කර වියදම් කිරීම සඳහා අවස්ථානුකූලව නියෝග සකස් කිරීම.
(2)	අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.	එලෙසම.	13.(2). අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.
(3)	සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් අනුමත කරනු නොලැබූ දින සිට පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය.	පනතේ 13.(3). උපවගන්තියේ " හැකි පහසු ඉක්මණින් " යන්නට ඉක්බිතිව "අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව" යන වචනය එකතු කිරීමෙන්.	13.(3). සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් අනුමත කරනු නොලැබූ දින සිට පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය.
(4)	අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.	එලෙසම.	13.(4). අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

		පනතේ 13.(4) උපවගන්තියට පසු 13.(5) උපවගන්තිය එකතු කිරීම.	13.(5). මෙම පනත යටතේ ප්‍රකාශයට පත් නොවන රජයේ හෝ රජයේ නොවන සත්වෝද්‍යානයක් හෝ සතුන් රඳවා තබන, ප්‍රදර්ශනය කරන, අලෙවි කරන ස්ථාන ලියාපදිංචි කිරීම, නියාමනය කිරීම, විධිවිධාන සැකසීම, කොන්දේසි පැනවීම සිදු කිරීම හා ඊට අදාළ විය හැකි කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සැදිය හැකිය.
14	පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි - "සතෙකු" යන්නෙන් පෘෂ්ඨවංශික හා අපෘෂ්ඨවංශික කවර වූ හෝ සතෙකු අදහස් වන අතර, ඊට සියලු වර්ග වල පක්ෂීන්, මත්ස්‍යයන්, හෝ උරගයන් ඇතුළත් වේ; තවද, "ජාතික සත්ව උද්‍යානය" යන්නට රජයේ මත්ස්‍ය තටාකය, රත්මලානේ පිහිටි සත්ව උද්‍යාන ගොවිපල සහ රඹුක්කන පින්නවල පිහිටි අලි අනාථාගාරය ඇතුළත් වේ.	පනතේ 14 වගන්තිය ඉවත් කර, පහත සඳහන් වගන්තිය එකතු කිරීම.	"සතෙකු "යන්නෙන් පෘෂ්ඨවංශික හා අපෘෂ්ඨවංශික කවර වූ හෝ සතෙකු අදහස් වේ. "සත්වෝද්‍යාන" යන්නට සත්වෝද්‍යාන, සෆාරි උද්‍යාන, අලි අනාථාගාර, මීන් මැදුරු, සත්ත්ව අභිජනන මධ්‍යස්ථාන, සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථාන, ඝාන සුරකුම් මධ්‍යස්ථාන, සත්වෝද්‍යානයට අයත් අධ්‍යාපනික මධ්‍යස්ථාන, සත්වෝද්‍යානයට අයත් කෞතුකාගාර, සත්වෝද්‍යානයට අයත් ගොවිපල ඇතුළු ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතන ඇතුළත් වේ. "සත්වෝද්‍යානයක භාරකරු" යන්නට යම් සත්වෝද්‍යානයක් පරිපාලනය හා කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාලයේදී ලියවිල්ලකින් පත් කරනු ලබන නිලධාරියෙකු ලෙස අදහස් වේ.

යෝජිත ආයතනික ව්‍යුහය

ඇමුණුම 02A

ශාක, සත්ව හා පරිසර පද්ධති සංරක්ෂණය පිළිබඳ ජාතික විද්‍යාත්මක සංවිධානය

පහත කරුණු සඳහා පහසුකම් සැලසීම මෙමගින් අපේක්ෂා කෙරේ. ජෛව විවිධත්වයේ ගුණාත්මක භාවිතය පිළිබඳව පර්යේෂණ සිදු කිරීම, සංරක්ෂණය සඳහා පරිසර පද්ධති හා තක්සේරු මගින් තීරණ ගැනීම සඳහා අවකාශය සැලසීම, සත්ත්ව විශේෂ භාවිතා කිරීම, ලාභයන් හා ප්‍රතිලාභ කොටස් බෙදීම.

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

- සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
- තාක්ෂණික අමාත්‍යාංශය
- පරිසර අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ සත්ව විද්‍යාත්මක සමීක්ෂණ සංධානය (යෝජිත)

(පර්යේෂණ ප්‍රමුඛතාවය, පර්යේෂණ, පාලනයකට යටත් කිරීම, රතු ලැයිස්තු ගත කිරිම සහය දැක්වීම, විෂයන් සඳහා පැවැත්වෙන ලැයිස්තු ගත කිරීම / වාණිජකරණය හා ප්‍රතිලාභ බෙදා හැරීම, සංශෝධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම, සහයෝගය ලබා දීම.)

- වනජීවී දෙපාර්තමේන්තුව
- කෞතුකාගාර දෙපාර්තමේන්තුව
- සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- ජාතික ජලජ සම්පත් පරිභෝජන සහ සංවර්ධන නියෝජිතායතනය(NARA)
- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.

ශ්‍රී ලංකාවේ ශාක විද්‍යාත්මක සමීක්ෂණ සංවිධානය (යෝජිත)

(පර්යේෂණ ප්‍රමුඛතාවය, පර්යේෂණ, පාලනයකට යටත් කිරීම, රතු ලැයිස්තු ගත කිරිම සහය දැක්වීම, විෂයන් සඳහා පැවැත්වෙන ලැයිස්තු ගත කිරීම / වාණිජකරණය හා ප්‍රතිලාභ බෙදා හැරීම, සංශෝධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම, සහයෝගය ලබා දීම.)

- උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
- වනජීවී දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂනායතනය
- පොල් පර්යේෂණ ආයතනය
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- රබර් පර්යේෂණ ආයතනය
- වී පර්යේෂණ ආයතනය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (ශාක නිරෝධායන)

- අවශ්‍ය විට උපදෙස් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI/වානිජ මණ්ඩලය/ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව/ජාතික ව්‍යවසනය සංවර්ධන මණ්ඩලය)

ජාතික විද්‍යා පදනම (NSF)
විද්‍යා,තාක්ෂණ,නව නිපැයුම,සඳහා සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)
රජයේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුව
ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)
ජාතික පර්යේෂණ සභාව (NRC)
ජාතික ජලජ ජීවී පර්යේෂණ අධිකාරිය (NARA)
කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා වූ සභාව (CARP)
විශ්ව විද්‍යාල
කාර්මික තාක්ෂණ ආයතනය(ITI)

ඇමුණුම 02

ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක්ව ඇති විශේෂයන්ගේ රතු ලැයිස්තුව (The National REDD List of 2012) හි ලැයිස්තුගත කර ඇති වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සතුන් සංරක්ෂණය කිරීම

ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක්ව ඇති විශේෂයන්ගේ රතු ලැයිස්තුව (REDD List) හි ලැයිස්තුගත කර ඇති වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සතුන් සංරක්ෂණය කිරීම සඳහා පුළුල් සහ බහුවිධ ප්‍රවේශයක් අවශ්‍ය වේ. 2021 සැප්තැම්බරයේ අවසන් යාවත්කාලීන කිරීම අනුව, IUCN රතු ලැයිස්තුවේ දැඩි ලෙස වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ශ්‍රී ලංකාවේ සමහර විශේෂවල නිශ්චිත ලැයිස්තුව වෙනස් වී ඇති නමුත් සංරක්ෂණය පිළිබඳ පොදු මූලධර්ම අදාළ වේ. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මෙම විශේෂ ආරක්ෂා කිරීම සඳහා ගත හැකි ප්‍රධාන පියවර සහ උපාය මාර්ග කිහිපයක් පහත දැක්වේ:

1. වාසස්ථාන ආරක්ෂා කිරීම සහ ප්‍රතිනිර්මාණය (Restoratio) කිරීම :

මෙම විශේෂ සඳහා තීරණාත්මක වාසස්ථාන හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. ආරක්ෂිත ප්‍රදේශ, ජාතික වනෝද්‍යාන සහ වනජීවී රක්ෂිත ස්ථාපිත කර ඵලදායී ලෙස කළමනාකරණය කළ යුතුය. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සතුන් සඳහා සුදුසු පරිසරයන් පුළුල් කිරීම සඳහා විනාශ වූ වාසස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම ද සිදු කළ හැකිය. මෙම කාර්යය වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි.

2. වනජීවී නීති බලාත්මක කිරීම :

මෙම සතුන්ට තර්ජනයක් වන දඩයම් කිරීම, නීති විරෝධී වෙළඳාම සහ අනෙකුත් මිනිස් ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා වනජීවී ආරක්ෂණ නීති සහ රෙගුලාසි දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ. වැරදිකරුවන් සඳහා දඬුවම් බාධාවක් ලෙස ක්‍රියා කිරීමට නීති ප්‍රමාණවත් විය යුතුය.

3. ප්‍රජා සහභාගීත්වය සහ අධ්‍යාපනය :

ප්‍රාදේශීය ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම සහ වනජීවී සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම ඉතා වැදගත් වේ. සංරක්ෂණ ප්‍රයත්නයන් සඳහා ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම සහ ඔවුන්ට විකල්ප ජීවනෝපාය ලබා දීමෙන් මිනිස්-වනජීවී ගැටුම් අවම කර සංරක්ෂණයට මුලපිරීම සඳහා සහයෝගීතාවය වැඩි දියුණු කළ හැකිය.

4. පර්යේෂණ සහ අධීක්ෂණය :

මෙම වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂයන් පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම ඔවුන්ගේ පරිසර විද්‍යාව (ecology), හැසිරීම සහ ඔවුන් මුහුණ දෙන තර්ජන වඩාත් හොඳින් අවබෝධ කර

ගැනීමට උපකාරී වේ. ගහනය ක්‍රමානුකූලව නිරීක්ෂණය කිරීමෙන් සංරක්ෂණ සැලසුම් සහ අනුවර්තන කළමනාකරණය සඳහා වටිනා දත්ත සැපයිය හැක.

5. **සහයෝගීතාවය සහ හවුල්කාරිත්වයන් :**

රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන (NGOs), පර්යේෂකයන් සහ ප්‍රදේශීය ප්‍රජාවන් අතර සහයෝගිතාව අත්‍යාවශ්‍ය වේ. හවුල්කාරිත්වයන් වඩාත් ඵලදායී සංරක්ෂණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සම්පත්, විශේෂඥතාව සහ දැනුම උපයෝගී කර ගත හැකිය.

6. **පරිභාහිර සංරක්ෂණය (විතැන් සංරක්ෂණය) :**

සමහර අවස්ථාවලදී, අභිජනන වැඩසටහන් **(Captive Breeding)** සහ පරිභාහිර සංරක්ෂණ පහසුකම් ස්ථාපිත කිරීම මගින් වඳවී යාමෙන් ආරක්ෂා කිරීමක් ලෙස ක්‍රියා කළ හැකිය. **මෙම වැඩසටහන් මගින් සතුන්ගේ ස්වභාවික ගහනය තවදුරටත් පහත වැටුනහොත් සතුන් බෝ කිරීමට සහ නැවත වනයට හඳුන්වා දීම** කළ හැක. **ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වනුයේ මෙහි සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම වේ.**

7. **තිරසාර සංචාරක ව්‍යාපාරය :**

වගකීම් සහගත සහ තිරසාර සංචාරක භාවිතයන් ප්‍රවර්ධනය කිරීම දේශීය ආර්ථිකයට සහ වනජීවී සංරක්ෂණ ප්‍රයත්නයන්ට ප්‍රතිලාභ ලැබිය හැකිය. සංචාරක ආදායම නැවත සංරක්ෂණ මූලාරම්භයන් වෙත යොමු කළ හැකිය.

8. දේශගුණික විපර්යාස ආමන්ත්‍රණය කිරීම :

දේශගුණික විපර්යාස බොහෝ විශේෂවලට සැලකිය යුතු තර්ජනයක් එල්ල කරයි. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මෙම සතුන්ගේ දිගුකාලීන පැවැත්ම සහතික කිරීම සඳහා තර්ජනය අවම කිරීමට ක්‍රියාකිරීම සහ අනුවර්තනය වීමේ උපාය මාර්ග හරහා දේශගුණික විපර්යාසවලට එරෙහිව සටන් කිරීම ඉතා වැදගත් වේ.

9. **ජාත්‍යන්තර සහයෝගීතාව :**

සමහර විශේෂවලට ශ්‍රී ලංකාවේ දේශසීමාවෙන් ඔබ්බට විහිදෙන සංක්‍රමණ රටා තිබිය හැක. එබැවින්, දේශසීමා සංරක්ෂණ ප්‍රයත්නයන් සඳහා අසල්වැසි රටවල් සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

10. **අඛණ්ඩ තක්සේරුව සහ අනුවර්තනය :**

නව තොරතුරු සහ වෙනස්වන තත්වයන් මත පදනම්ව සංරක්ෂණ උත්සාහයන් අඛණ්ඩව ඇගයීමට ලක් කළ යුතුය. දිගුකාලීන සාර්ථකත්වය සඳහා සංරක්ෂණ සැලසුම්කරණයේ නම්‍යශීලීභාවය ඉතා වැදගත් වේ.

සංරක්ෂණය යනු විවිධ පාර්ශ්වකරුවන්ගේ කැපවීම, සම්පත් සහ දිගුකාලීන කැපවීම අවශ්‍ය වන අභියෝගාත්මක සහ අඛණ්ඩ ක්‍රියාවලියකි. සෑම විශේෂයකටම අනන්‍ය අභියෝග සහ අවශ්‍යතා තිබිය හැකි අතර, ඒ සඳහා සකස් කළ සංරක්ෂණ උපාය මාර්ග අවශ්‍ය වේ. සංරක්ෂකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයන් සහ මහජනතාව මෙම දැඩි වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සතුන් ආරක්ෂා කිරීමට සහ අනාගත පරම්පරාව සඳහා ශ්‍රී ලංකාවේ පොහොසත් ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට එක්ව කටයුතු කළ යුතුය.

ඒ අනුව වඳ වී යාමේ තර්ජනයට ලක් වූ සතුන් සංරක්ෂණය කිරීම සඳහා අන්තර් ආයතනික ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක විය යුතු අතර ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට ද එහි කාර්යභාරයක් පැවරේ. ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්කම කිරීම සඳහා දායක විය යුතු ආයතන හඳුනාගෙන ඇති අතර ඒ පිළිබඳව විස්තර ඇමුණුම 02A ලෙස යාකර ඇත. අන්තර් ආයතනික කමිටුවක් පත් කිරීම වනජීවි හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ද එකඟතාවය මත රතු දත්ත පොත සකස් කරන පරිසර අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් සිදුකිරීම සුදුසු බවත් එම ;කමිටුව මඟින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ඇමුණුම 04

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සඳහා විදේශිය පක්ෂීන් මිල දී ගැනීම.

රිදියගම සෆාරි උද්‍යානය ඉදිකිරීමත් සමඟ එහි විදේශිය පක්ෂි කලාපයක් ඇති කිරීම හා දෙහිවල සත්වෝද්‍යානය තුල තනිව ජීවත් වූ පක්ෂීන් සඳහා සහකරුවන් ලබා දීමේ අරමුණ ඇතිව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සඳහා විදේශිය පක්ෂීන් මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2018 වර්ෂයේ දී ආරම්භ කර ඇත.

සත්වෝද්‍යාන සඳහා අවශ්‍ය වන සතුන් සත්ත්ව හුවමාරු වැඩසටහන් මගින් හුවමාරු කර ගැනීම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන සාමාන්‍ය ක්‍රියාවලිය වූ නමුත් මෙහි දී සත්ත්ව හුවමාරු කටයුතු සිදුකිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රමාණයෙන් පක්ෂීන් දෙපාර්තමේන්තුව සතු නොවීම හා දුර්ලභ ගණයේ පක්ෂීන් විශේෂ 32 ක් මිල දී ගැනීමේ අවශ්‍යතාවය ඇති වූ බැවින් 2018 වර්ෂයේ සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මගින් ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීම සිදුකර මෙම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

මෙ සඳහා මිල ඇස්තමේන්තු සකස් කිරීම හා අදාළ ලංසු ලියකියවිලි සකස් කිරීම සඳහා සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සැදුම්ලත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් 2018.01.02 දිනැති ලිපිය මගින් පත් කිරීම සිදුකර ඇත.

එහි දී එම තාක්ෂණික කමිටු සාමාජිකයින් විසින් එවකට ඔවුන් වෙත ලබා ගත හැකි වූ තොරතුරු මත පදනම්ව වඩාත්ම නිවැරදි වූ ඇස්තමේන්තුවක් හා ලංසු ලියකියවිලි සකස් කිරීම සිදුකර ඇත. මෙහි දී මිල දී ගැනීමට අපේක්ෂා කරන ලද පක්ෂීන් විදේශිය වශයෙන් ද දුර්ලභ සත්ත්වයන් වූ බැවින් නිරවද්‍යතාවයෙන්ම එම සතුන් අලෙවි වන මිල පදනම් කර ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුවට නිර්නායකයන් සොයා ගැනීම ප්‍රායෝගිකව අපහසු වී ඇත. එහෙත් ඒ සඳහා සාධාරණ ක්‍රමවේදයක් ලෙස විදේශීය පක්ෂීන් අලෙවි කරනු ලබන වෙබ් අඩවි වල පල වූ මිල ගණන් පදනම් කර ගැනීමෙන් ඇස්තමේන්තු සකස් කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව කටයුතු කර ඇත. මෙහි දී උදාහරණයක් ලෙස ඇමෙරිකානු එක්සත් ජනපද සත්වෝද්‍යානයක් සඳහා ශ්‍රී ලංකා මීමින්නෙකු මිල දී ගැනීමට අවශ්‍යතාවය ඇති වූ අවස්ථාවක ශ්‍රී ලංකා මීමින්නකුගේ වටිනාකම ගණනය කර ගැනීමේ දී ඇති වන දුර්වලතාවය වැනි ගැටලුවකට තාක්ෂණික ඇගයීම් කමිටුවට මෙහි දී මුහුණපෑමට සිදු වී ඇත.

එසේම මෙම පක්ෂීන් ගෘහාශ්‍රිතව ඇති කරනු ලබන පක්ෂීන් නොවීම මත පක්ෂීන් අලෙවි කිරීම සිදුකරනු ලබන වෙබ් අඩවි මගින් වුව ද දෛනික මිල විචලනයන් යාවත්කාලීන කිරීම සිදුවීම අපේක්ෂා කිරීම ද සිදුකල නොහැකි බැවින් එම අවස්ථාවේ දී සිදුකළ හැකි වූ නිවැරදිම ක්‍රියාවලිය ලෙස විදේශියව පක්ෂීන් විකිණීම සිදුකරනු ලබන වෙබ් අඩවි මගින් තොරතුරු සොයා බලා

දෙපාර්තමේන්තුව වෙත මිල දී ගැනීමට අපේක්ෂිත වූ පක්ෂීන් සඳහා වූ සාධාරණ මිල පදනම් කර ගනිමින් ඇස්තමේන්තු සකස් කිරීම සිදුකර ඇත.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 වන පරිච්ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගැනීමට පළමුව සැලකිය යුතු කරුණු වන භාණ්ඩ හා සේවාවල ස්වභාවය යන්න පිළිබඳ අවධානය යොමු කර ඇති තාක්ෂණික ඇගයීම කමිටුව විසින් මෙහි දී මිලදී ගනුයේ ජීවී සතුන් සහ කරුණු පිළිබඳ මහා සැලකිල්ලට යොමු කොට ජාතික තරඟකාරී ලංසු කැඳවීමට යෝජනා කර ඇත. ඒ මන්දයත් ජීවී සතුන් මිලදී ගැනීමේ දී ජාත්‍යන්තර ගණුදෙනුවක ඉතා විශාල අවධානමක් දැරීම රජයට සහ ආයතනයට අභාසි සහගත වන බැවිනි. යම් හේතුවකින් ජාත්‍යන්තර ලංසු කැඳවීමක් සිදුකර ආනයනය කරනු ලබන පක්ෂීන් තොගයම යම් ස්වභාවික අනතුරකට හෝ බෝවන රෝගයකට ලක්ව ශ්‍රී ලංකාව වෙත ළඟා වූවහොත් හෝ දෙපාර්තමේන්තු අවශ්‍යතාවට අදාළ වන වර්ගයේ, පෙලපත් වර්ණයේ නොවන පක්ෂීන් ලබා දීම සිදුකල හොත් එම පක්ෂීන් මාරු කිරීම් සිදුකිරීමට ජාත්‍යන්තර ආයතනයක් සමඟ ගණුදෙනු කිරීමේ දී අපහසුතාවයන්ට මුහුණදීමට සිදුවීම, විදේශීය ව්‍යාපාරිකයින්ගේ දුරස්ථභාවය සහ සන්නිවේදන බිඳවැටීම් ආදිය නිසා ඔවුන් පිළිබඳ විශ්වාසනීයත්වයක් ඇතිකර ගැනීම දුෂ්කර වීම, ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේදී විවිධ රටවල තානාපති කාර්යාල හරහා එය සිදුකළ යුතු බැවින් ක්‍රියාවලිය ඉතා දුෂ්කර සහ අධික පිරිවැයක් වැයවීම හා ඒ සඳහා ඉවත්කර තිබූ ප්‍රසම්පාදන සීමාසහිත වීම නිසා ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමය තාක්ෂණික ඇගයීම කමිටුව තෝරාගෙන ඇත.

එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1.(අ)(ii) වගන්තිය ප්‍රකාරව තරඟකාරී බව ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික පුවත්පත් වල දැන්වීම පළකරමින් තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා කටයුතු කර ඇත.

එසේ තාක්ෂණික ඇගයීම කමිටුව විසින් සකස් කරන ලද ලංසු ලියකියවිලි හා ඇස්තමේන්තුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් අනුමත කිරීම සිදුකර ඇති බැවින් ප්‍රසම්පාදනයේ ඉදිරි පියවර සිදුකිරීමට කටයුතු කර ඇත.

මෙහි දී ලංසුකරුවන් තිදෙනෙකු ලංසු ඉදිරිපත් කිරීම සිදුකර ඇති නමුත් ඉන් ලංසුකරුවන් දෙදෙනකු විසින් ලංසු ලියකියවිලි වල සටහන් වූ කොන්දේසි කඩකර මිල ගණන් ඉදිරිපත් කිරීම සිදුකර තිබුණි. එම තොරතුරු පහත දක්වා ඇත.

Bird research center and resort (Pvt) Ltd

මෙම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සමඟ ප්‍රසම්පාදනයේ දී දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ කොන්දේසියක් වන "පක්ෂීන් භාර දීමෙන් පසු මසක නිරෝධායන කාලයකින් පසුව පමණක් ගෙවීම් කරනු ලැබේ" යන කොන්දේසියට විරුද්ධව කොන්දේසියක් ඉදිරිපත් කරමින්

"පක්ෂීන් ආයතනය වෙත සැපයූ වහාම ගෙවීම සිදුකල යුතුය" යන්න සිය ලංසු ලේඛනවල සටහන් කර තිබී ඇත.

මෙ අනුව මසක කාලයක් සඳහාවත් එම පක්ෂීන් තබා ගැනීම සම්බන්ධයෙන් විශ්වාසය පළ කිරීමක් එම ආයතනය විසින් සිදු නොකරන තත්ත්වයක් යටතේ එම ආයතනය මඟින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සියල්ලම ප්‍රතික්ෂේප කිරීමට සිදු වී ඇත.

Hidellana Tea Factory

මෙම ආයතනය මඟින් අයිතම හතරක් සඳහා මිල ඉදිරිපත් කර ඇති අතර ඉන් එක් අයිතමයක මිල ටෙන්ඩරය පිරිනමනු ලැබූ ආයතනයට (07) (Mandarin Duck) වඩා වැඩි ව තිබූ අතර අනෙක් අයිතම 3 සඳහාම ඉදිරිපත් කර ඇත්තේ එක් එක් අයිතමය සඳහා ඉල්ලා තිබූ පක්ෂීන් ප්‍රමාණයට වඩා අඩු සංඛ්‍යාවක් වූ බැවින් එම ලංසුපත ද ප්‍රතික්ෂේප කර ඇත. මෙහි දී දෙපාර්තමේන්තුව විසින් මිල දී ගැනීමට අපේක්ෂිත පක්ෂීන් ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් ලංසුකරුගේ මිල අවම වූ පමණින් මිල දී ගැනීම ප්‍රායෝගික නොවී ඇති බැවින් හා එය ලංසු කොන්දේසි වලට පටහැනි වී ඇති බැවින් මෙම ලංසුකරු ද ප්‍රතිකේෂප කර ඇත.

ඒ අනුව ඉහත තොරතුරු මත පදනම්ව දෙපාර්තමේන්තු අවශ්‍යතාවයට වඩාත්ම සරානුකූල ප්‍රතිචාරය දැක් වූ Felicity Holdings පුද්ගලික සමාගම මඟින් පක්ෂීන් මිල දී ගැනීම සිදුකර ඇත.

01 - ඇvüi

ඇමුණුම 05

ව්‍යාපෘතිය	කොන්ත්‍රාත්කරුගේ නම	වටිනාකම	2023/07/31 දිනට දරන ලද වියදම	වැඩ ආරම්භ කල දිනය	වැඩ අවසන් කල යුතු දිනය	දින දීර්ඝ කිරීම	කොන්ත්‍රාත්තුව අත්හිටුවා ඇත්නම් ඊට හේතුව
Gravel Road in Elephant Zone	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	70.602.875.80	33.258.155.04	2016/12/14	2017/03/16		දුර්වල ප්‍රගතිය හේතුවෙන් Terminate කර ඇත.සිදු කරන ලද වැඩ ප්‍රමාණයට අදාල අවසන් බිල්පත් ඉදිරිපත් කරන ලෙස NEMO ආයතනය වෙත දැනුම් දුන්නද ඒ සදහා ප්‍රතිචාරයක් දක්වා නොමැති හෙයින් 2023/04/24 දින අවසන් නිවේදන ලිපියද නිකුත්කර ඇති අතර ඒ සදහාද NEMO ආයතනය ප්‍රතිචාර දක්වා නොමැති හෙයින් CECB ආයතනය සමග අවසන් බිල්පත් සකස් කරමින් පවතී. ඉතිරි වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වැඩ කොටස් ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.
Service Road in Small Animal Kingdom	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	24.323.915.81	5.558.729.41	2017/09/13	2018/01/11	2018/03/26	දුර්වල ප්‍රගතිය හේතුවෙන් Terminate කර ඇත.සිදු කරන ලද වැඩ ප්‍රමාණයට අදාල අවසන් බිල්පත් ඉදිරිපත් කරන ලෙස NEMO ආයතනය වෙත දැනුම් දුන්නද ඒ සදහා ප්‍රතිචාරයක් දක්වා නොමැති හෙයින් 2023/04/24 දින අවසන් නිවේදන ලිපියද නිකුත්කර ඇති අතර ඒ සදහාද NEMO ආයතනය ප්‍රතිචාර දක්වා නොමැති හෙයින් CECB ආයතනය සමග අවසන් බිල්පත් සකස් කරමින් පවතී. ඉතිරි වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වැඩ කොටස් ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.
African Elephant Enclosure	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	12.614.878.30	1.599.166.96	2017/11/24	2018/03/24		දුර්වල ප්‍රගතිය හේතුවෙන් Terminate කර ඇත.සිදු කරන ලද වැඩ ප්‍රමාණයට අදාල අවසන් බිල්පත් ඉදිරිපත් කරන ලෙස NEMO ආයතනය වෙත දැනුම් දුන්නද ඒ සදහා ප්‍රතිචාරයක් දක්වා නොමැති හෙයින් 2023/04/24 දින අවසන් නිවේදන ලිපියද නිකුත්කර ඇති අතර ඒ සදහාද NEMO ආයතනය ප්‍රතිචාර දක්වා නොමැති හෙයින් CECB ආයතනය සමග අවසන් බිල්පත් සකස් කරමින් පවතී. ඉතිරි වැඩ කොටස්

							සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වැඩ කොටස් ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.
Lion Den No- III	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	10,706,866.87	3,559,730.25	2017/03/01	2017/07/29		දුර්වල ප්‍රගතිය හේතුවෙන් Terminate කර ඇත.සිදු කරන ලද වැඩ ප්‍රමාණයට අදාල අවසන් බිල්පත් ඉදිරිපත් කරන ලෙස NEMO ආයතනය වෙත දැනුම් දුන්නද ඒ සඳහා ප්‍රතිචාරයක් දක්වා නොමැති හෙයින් 2023/04/24 දින අවසන් නිවේදන ලිපියද නිකුත්කර ඇති අතර ඒ සඳහාද NEMO ආයතනය ප්‍රතිචාර දක්වා නොමැති හෙයින් CECB ආයතනය සමග අවසන් බිල්පත් සකස් කරමින් පවතී. ඉතිරි වැඩ ප්‍රමාණය සඳහා සීමිත තරගකාරී ලංසු කැඳවීමෙන් කොන්ත්‍රාත් පිරිනමා ඇත.
Tree Huts	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	11,257,890.00	6,062,214.93	2017/05/12	2017/09/09		දුර්වල ප්‍රගතිය හේතුවෙන් Terminate කර ඇත.සිදු කරන ලද වැඩ ප්‍රමාණයට අදාල අවසන් බිල්පත් ඉදිරිපත් කරන ලෙස NEMO ආයතනය වෙත දැනුම් දුන්නද ඒ සඳහා ප්‍රතිචාරයක් දක්වා නොමැති හෙයින් 2023/04/24 දින අවසන් නිවේදන ලිපියද නිකුත්කර ඇති අතර ඒ සඳහාද NEMO ආයතනය ප්‍රතිචාර දක්වා නොමැති හෙයින් CECB ආයතනය සමග අවසන් බිල්පත් සකස් කරමින් පවතී. ඉතිරි වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වැඩ කොටස් ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.
16 Feet Chain Link Fence between Asian Elephant Zone Stage-II Area & Leopard Zone	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය	43,588,320.62	23,080,006.12	2017/09/13	2018/03/12		දුර්වල ප්‍රගතිය හේතුවෙන් Terminate කර ඇත.ඉතිරි වැඩ ප්‍රමාණය සඳහා දෙපාර්තමේන්තුව මගින් අමු ද්‍රව්‍ය සපයා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සේවකයන්ගේ ශ්‍රම දායකත්වය ලබා ගෙන ඇත.රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා නිකුත්කළ 2022/04/26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම කොන්ත්‍රාත්තුව තාවකාලිකව නතර කර ඇත. ඉතිරි වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වැඩ කොටස් ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.

Exotic Bird Enclosure	රුලික් ඉංජිනියරින් පුද්ගලික සමාගම	72,496,765.00	38,893,304.48	2019/10/08	2020/05/05	2021/06/25	COVID-19 වසංගත තත්වයන් සමග නිකුත්කළ 2020/04/16 දිනැති ගැසට් නිවේදනය මගින් ආනයන සීමා පැනවීම හේතුවෙන් Stainless Steel දැල සහ උපාංග විනයෙන් ආනයනය කිරීම දුෂ්කර වීම,ඉන්පසු ඩොලරයේ අගය ඉහල යාම හා රට තුල ඩොලර් හිගවීම හේතුවෙන් අමුද්‍රව්‍ය මිල ඉහල යාම නිසා කොන්ත්‍රාත්කරු විසින් Stainless Steel දැල සහ උපාංග වෙනුවෙන් මිල විචලනයන් ඉල්ලා සිටීම.රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා නිකුත්කළ 2022/04/26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව මෙම කොන්ත්‍රාත්තුව 2022/08/31 දින Mutual Terminate කර ඇත. ඉතිරි වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වැඩ කොටස් ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.
Cheetah-Dens & Pens	සුමනසේකර කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම	21,072,385.30	5,582,153.23	2019/03/25	2019/07/23	2019/08/30	දුර්වල ප්‍රගතිය සහ කොන්ත්‍රාත්කරු විසින් 2020/03/31 දිනට පසු කාර්ය සාධන ඇපකර දීර්ඝ නොකිරීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව 2021/04/08 දින Terminate කර ඇත. ඉතිරි වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වැඩ කොටස් ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.
Boundary Fence & Gates in Leopard Zone	රන්වැලි කන්ස්ට්‍රක්ෂන්	59,013,022.88	18,843,313.98	2019/09/04	2020/03/02	2020/08/18	දුර්වල ප්‍රගතිය හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව 2021/10/11 දින Terminate කර ඇත. ඉතිරි වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම වැඩ කොටස් ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.

ඇමුණුම 06

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
ඉදිරි මාස 06 සඳහා වැඩසටහන

- එක් එක් විෂයය පථයට අදාළ ප්‍රාමාණික විද්වතුන් සමඟ සාකච්ඡා වාර 05ක් පැවැත්වීම - 2023 අගෝස්තු හා සැප්තැම්බර්
- එක් එක් විෂයය පථයට අදාළව කෙටුම්පත් සකස් කිරීම - 2023 ඔක්තෝබර්
- සකස් කරන ලද කෙටුම්පත් පිළිබඳ නැවත සාකච්ඡා වාරයක් පැවැත්වීම - 2023 නොවැම්බර්
- අවසන් ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම හා වැඩමුළුවක් පවත්වා එහි වලංගුභාවයට (Validation) පත් කිරීම හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීම - 2023 දෙසැම්බර්